රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளாராட்சி அமைச்சு

Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

இலங்கை உள்ளூர் ஆளுகை நிறுவகம்

Sri Lanka Institute of Local Governance

වාර්ෂික වාර්තාව 2021

ஆண்டறிக்கை 2021

ANNUAL REPORT 2021

අංක ,17,
මළලසේකර මාවත,
කොළඹ 07.

இலக்கம் 17,
மலலசேகர மாவத்தை,
கொழும்பு 07.

No.17,
Malalasekara Mawatha,
Colombo 07.

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

පටුන

		පිටු අංක
1.0.	**හැඳින්වීම**	01
1.1.	දැක්ම	01
1.2.	මෙහෙවර	01
1.3.	අභිමතාර්ථ	02
1.4.	ආයතනයේ ක්‍රියාකාරී විෂය පථය	02
1.5.	ප්‍රධාන ක්‍රියාත්මක ක්ෂේත්‍ර	05
1.6.	පාලක සභාවේ පණිවුඩය	06
1.7.	පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ සංවිධාන ව්‍යුහය	08
1.8.	2021 වර්ෂය තුල සේවයේ නියුතු කාර්ය මණ්ඩලය	09
1.9.	2021 වර්ෂය සඳහා ආයතනයේ සිටින කාර්ය මණ්ඩලයේ නම් සහ තනතුරු	10
2.0.	**සැකැස්ම**	**11**
2.1.	පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය හැඳින්වීම	11
2.2.	ආයතනික පාලන ප්‍රකාශනය	12
2.3.	පාලක සභාවේ සාමාජිකයන්	13
2.3.1	2021 වර්ෂයේ පැවති පාලක මණ්ඩල රැස්වීම්	15
2.4.	විගණන හා කළමනාකරණ කමිටුව	17
2.5	2021 වර්ෂයේ පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්	18
3.0.	**ආයතනයේ බලවරම සහ පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල කාර්යසාධනය වැඩි දියුණු කිරීම සඳහා ආයතනය සතු භූමිකාව සමාලෝචනය කිරීම.**	**19**
3.1.	හැඳින්වීම	19
3.2.	ඉලක්කගත කණ්ඩායම	20
3.3.	සම්බන්ධීකරණය සහ අධීක්ෂණය	23
3.4.	ව්‍යාපාර ප්‍රවර්ධන කටයුතු	23
3.5.	ජාතික/ ජාත්‍යන්තර පුහුණු සහ අධ්‍යාපන ආයතන සමඟ සබඳතා	23
3.6.	පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ සංවිධාන පරිසරය	24
3.7.	පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ ඇල්මැති පාර්ශවයන්හි ව්‍යුහය	24
3.8.	පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ විශේෂ අවස්ථා	26

4.0. 2021 වර්ෂය තුළ ආයතනයේ සමස්ත කාර්යසාධනය **28**

4.1. 2021 වර්ෂය තුල පවත්වන ලද කෙටි කාලීන පුහුණු වැඩසටහන් 28
4.1.1 පළාත් මට්ටමෙන් පවත්වන ලද වැඩසටහන් සාරාංශය 30
4.1.2 සියලු අංශ වල අයවැයගත ප්‍රතිපාදන හා තත්‍ය වියදම 30
4.2. 2021 වර්ෂය තුල ක්‍රියාත්මක කල ඩිප්ලෝමා සහතිකපත්‍ර පාඨමාලා සංඛ්‍යා තොරතුරු 31
4.3. 2021 වර්ෂය තුල පර්යේෂණ සහ සංවර්ධන අංශය ක්‍රියාත්මක කල පර්යේෂණ සංඛ්‍යා තොරතුරු 31
4.4 මහා භාණ්ඩාගාරය අරමුදල් මූල්‍යමය වශයෙන් උපයෝජනය සංසන්දනය-2017,2018,2019,2020,2021 32
4.5. පසුගිය වසර කිහිපය සඳහා ලාභ/අලාභ තත්වයන් 32
4.6. ආයතනයේ එක් එක් අංශයේ කාර්යසාධනය පිළිබඳ තොරතුරු 33
4.6.1 අධ්‍යක්ෂ අංශය 33
4.6.2 ඉංජිනේරු අංශය 34
4.6.3 පොදු කළමනාකරණ සහ මනාව සම්පත් සංවර්ධන අංශය 34
4.6.4 භෞතික සැලසුම් සහ පරිසර අංශය 36
4.6.5. මූල්‍ය කළමනාකරණ අංශය 37
4.6.6 නීති හා ව්‍යවස්ථාපිත කටයුතු අංශය 38
4.6.7 අධ්‍යන හා පුහුණු අංශය 40
4.6.8 පර්යේෂණ සහ සංවර්ධන අංශය 41
4.6.9 තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අංශය 42

4.7. UNDP-CDLG ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක ධාරිතා සංවර්ධන වැඩසටහන් 43

5.0. විගණන මතය 2021 **44**

6.0 මූල්‍ය තොරතුරු **50**

7.0 අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරීගේ පණිවිඩය **92**

1.0. හැඳින්වීම

දිවයිනේ පළාත් පාලනය සම්බන්ධයෙන් සංවර්ධන ඉදිරි දැක්මක් අවශ්‍ය වූ වාතාවරණයක් තුළ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය බිහි විය. මෙම දැක්ම යතාර්ථයක් බවට පත් කර ගැනීම සඳහා මේ සම්බන්ධයෙන් අධ්‍යනයක් සිදු කොට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා 1997 වර්ෂයේදී ජනාධිපති කොමිෂන් සභාවක් පත් කරන ලදී. පළාත් පාලන ක්ෂේත්‍රයේ කාර්යසාධනය ඉහළ නැංවීමේ අවශ්‍යතාව සපුරාගැනීම සඳහා ජාතික ආයතනයක් නිර්මාණය කිරීමේ වැදගත්කම මෙම කොමිෂන් සභාව මගින් අවධාරණය කරන ලදී. පළාත් පාලන ක්ෂේත්‍රය සංවර්ධන ක්‍රියාකාරකම් කෙරෙහි සෘජුවම දායක විය හැකි සහ ජනතාවගේ ජීවන තත්ත්වයන් නගා සිටුවීම වෙනුවෙන් ස්වකීය අභිලාෂයන් මුදුන් පමුණුවා ගත හැකි කාර්යක්ෂම සහ සතුටුදායක සේවයක් ජනතාවට සැපයිය හැකි ස්වයං අධිකාරි බලයක් සහිත ස්වාධීන ක්ෂේත්‍රයක් වශයෙන් සැලකිය යුතු බව ජනාධිපති කොමිෂන් සභාව විසින් සලකනු ලැබීය.

මෙම ඉලක්ක අත්පත් කර ගැනීම කෙරෙහි යොමු වී කටයුතු කළ හැකි වඩාත්ම යෝග්‍ය ආයතනය වශයෙන් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය සලකන ලදී. ජනතාවට ඉතාම සමීප ආයතනයක් වශයෙන් මහජනතාව නියෝජනය කරන නියෝජන ආයතන ව්‍යුහයක් වශයෙන් ක්‍රියා කිරීමේ හැකියාව මෙම ආයතනය සතු වේ.

මෙම අභිමතාර්ථ පෙරදැරි කරගනිමින්, වර්ෂ 1999 අංක 31 දරණ පාර්ලිමේන්තු පනත මගින් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය ස්ථාපිත කරන ලද අතර එහි කර්තව්‍යයන් එම වසරේම ඔක්තෝබර් මස ආරම්භ කරන ලදී.

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ මෙම ආයතනය ක්‍රියාත්මක වේ.

1.1. *දැක්ම*

“ පළාත් පාලනය පිළිබඳ විශිෂ්ඨත්වයේ මධ්‍යස්ථානය බවට පත්වීම”

1.2. *මෙහෙවර*

"පුහුණුව, උපදේශන සහ පර්යේෂණ තුළින් පළාත් පාලනයේ ක්‍රියාකාරී පුද්ගලයින්ගේ සහ ආයතනවල නිපුණතා සහ ධාරිතාවන් වර්ධනය කිරීම"

1.3 අභිමතාර්ථ

- පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකක සමඟ හවුල්කාරිත්වයෙන් පළාත් සභා සහ පළාත් පාලන ආයතන, ආයතනික වශයෙන් සවිමත් කිරීම ඉහළ නැංවීම සඳහා කාර්යසාධනය වැඩි දියුණු කිරීමේ වැඩසටහන් සම්පාදනය කිරීම.

- පළාත් සභා සහ පළාත් පාලන ආයතන ව්‍යුහයන්ගේ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා සහ ඒවාට සහාය සැළසීම සඳහා පුහුණු වැඩසටහන් සම්පාදනය කිරීම හා පුහුණු අවස්ථා උදා කිරීම කෙරෙහි නැඹුරු වෙමින් පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකකවල ශක්‍යතාවයන් ඉහළ නැංවීම.

- පළාත් පාලනයට අදාළ පාර්ශ්වකරුවන් හට තාක්ෂණික සහ අනෙකුත් තොරතුරු සපයනු ලබන, පළාත් සභා හා පළාත් පාලන ආයතන සඳහා වන සම්පත් මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියාත්මක වීම.

- අදාළ ජාතික සහ ජාත්‍යන්තර ආයතනයන් සමඟ සහයෝගීත්වයෙන් පළාත් සභා සහ පළාත් පාලන ආයතන සඳහා කේන්ද්‍රීය ආයතනය වශයෙන් කටයුතු කිරීම

- මානව සම්පත් සංවර්ධනය, කළමනාකරණ පද්ධති වැඩි දියුණු කිරීම සඳහා විශේෂ සහාය සේවා සැපයීම සහ උප ජාතික මට්ටමේ රාජ්‍ය ආයතනවල ආයතනික වෙනස්කම් සඳහා පහසුකම් සැලසීම.

- පළාත් සභා සහ පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම සඳහා පුහුණු, උපදේශන සහ පර්යේෂණ සේවා කාර්යක්ෂම සහ සාධනීය ආකාරයෙන් සැපයීමට හැකියාව නිර්මාණය වන පරිදි පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ කාර්යසාධනය ඉහළ නැංවීම

1.4. ආයතනයේ ක්‍රියාකාරී විෂය පථය

1999 අංක 31 දරන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනතේ 1 වන කොටසේ දක්වා ඇති පරිදි වත්මන් දේශපාලන, නෛතික සහ ආර්ථික සන්දර්භය තුල අවධානය යොමු කල යුතු වැදගත් කේන්ද්‍රීය ක්ෂේත්‍ර අවධාරණය කිරීම සඳහා පහත පරිදි පෙළ ගස්වා ඇත.

- රට තුළ යහපාලනය ඇතිවීම සහතික කිරීමේ අරමුණින් පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල අනුයුක්තව කටයුතු කරන සභිකයන්ට,නිලධරයන්ට සහ සේවකයන්ට ඔවුන්ගේ රාජකාරී කටයුතු වඩාත් කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස ඉටු කිරීමට හැකිවන පරිදි ඒ සභිකයන්ට, නිලධරයන්ට හා සේවකයන්ට පුහුණුව සලසා දීම.

- පළාත් හා පළාත් පාලන කළමනාකරණය පිළිබඳ වැඩ මුළු හා පුහුණු පාඨමාලා පැවත්වීම.

- ආයතනය විසින් පවත්වනු ලබන පුහුණු පාඨමාලා සාර්ථක ලෙස අවසන් කර ඇති තැනැත්තන්ට සහතික පත්‍ර ප්‍රධානය කිරීම.

- යහපත් රාජ්‍ය පාලනයක් ඇති කිරීම තහවුරු කිරීමේ අදහසින් රට තුල ප්‍රවීණ පළාත් හා පළාත් පාලන නිලධාරයන්ගෙන් හා පිරිස්වලින් සමන්විත සේවක ගණයක් ගොඩනැංවීමෙහිලා සහාය වීම.

- පළාත් සභාවල හා පළාත් පාලන ආයතනවල සංවිධාන පද්ධති හා කළමනාකරණ හැකියාවන් වැඩි දියුණු කිරීමෙන් ඒ පළාත් සභාවලට සහ පළාත් පාලන ආයතනවලට සහාය වීම
- පළාත් හා පළාත් පාලන ක්ෂේත්‍රයේ උපදේශන තත්ත්වයේ පැවරුම් භාර ගැනීම.

- පළාත් සභාවල හා පළාත් පාලන ආයතනවල කළමනාකරණ පද්ධතිවල හා පරිවයන්හි විවේචනාත්මක ඇගයීමක් කිරීමෙහි ලා මණ්ඩපයක් ඇති කිරීම.

- කළමනාකරණ සංවර්ධනය සහ වැඩ පිළිබඳ ප්‍රතිමාන ස්ථාපිත කිරීම, වන්දි හෙවීමේ ක්‍රම නිශ්චය කිරීම සහ සාමාන්‍යයෙන් පළාත් කලමනාකරණ සංවර්ධන පුහුණු ඒකකවල සහ පළාත් පාලන ආයතනවල ඵලදායකත්වය වැඩිදියුණු කිරීම පිණිස ඒ පළාත් කළමනාකරණ සංවර්ධන සහ පුහුණු කිරීමේ ඒකකවල හා පළාත් පාලන ආයතනවලට සහාය වීම

- ආයතනයේ පරමාර්ථ හා සමාන පරමාර්ථ ඇති ලංකාව තුල හෝ විදේශයන්හි පිහිටි වෙනත් සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම


- පළාත් සභා සහ පළාත් පාලනය පිළිබඳ සම්මේලන සහ සම්මන්ත්‍රණ සඳහා අනුග්‍රහය දැක්වීම සහ පැවැත්වීම සහ ඒ පිළිබඳව පොත්පත් හා සගරා පළ කිරීම.

- පළාත් පාලන ක්ෂේත්‍රය තුළ ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා ගරු අමාත්‍යවරයාට අවශ්‍ය තොරතුරු ලබා දීම

- ආයතනයේ කර්තව්‍යයන් හා කටයුතු පිළිබඳව අදාළ ආයතන හා මහජනතාව අතර තොරතුරු පතළ කිරීම

- පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල සියලු අංශයන් පිළිබඳව පර්යේෂණ පැවැත්වීම,
- ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා සහාය වීම.

1.5. ප්‍රධාන ක්‍රියාත්මක ක්ෂේත්‍ර



රූපසටහන 1.1

1.6. පාලක සභාවේ පණිවුඩය

වසර විසි දෙකකට පෙර, එනම් 1999 වසරේදී ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන සහ පළාත් සභාවල තේරී පත් වූ සභිකයන්ගේ සහ කාර්ය මණ්ඩලයේ ශක්‍යතා වර්ධනය කෙරෙහි නැඹුරු වෙමින් පැහැදිලි දැක්මක් සහිතව පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (SLILG) නිර්මාණය කරන ලදී.

මෙම කාලවකවානුව තුළ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් රට තුළ සහ රටින් පිටත පළාත් පාලන ක්ෂේත්‍රය සඳහා වන පුහුණු වැඩසටහන්, දේශීය වැඩසටහන් සහ විදෙස් වැඩසටහන් වශයෙන් පවත්වා ඇත. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය තුළ ස්ථාපිත ක්‍රියාත්මක අංශ මගින් පළාත් පාලනයට අදාළ පුළුල් පරාසයක විෂයයන් ඉලක්ක කරගනිමින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙම මෙහෙවර හා සමගාමීව පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් සාර්ව ආර්ථික පාලන ප්‍රතිපත්ති, මූල්‍ය සහ නෛතික ගැටළු පිළිබඳ සංඛ්‍යාලේඛන ආශ්‍රිත පුහුණු අවස්ථා 50,000 කට වැඩි රජයේ නිලධාරීන් සහ තේරී පත් වූ සභිකයන් සඳහා සිය ක්‍රියාත්මක වකවානුව තුල ලබා දී ඇත.


ගෝලීය වසංගත තත්වයක් වූ කොවිඩ් -19, 2019 වසරේ ශ්‍රී ලංකාව තුල ව්‍යාප්ත වීමත් සමග වඩාත් තීරණාත්මක හා අභියෝගාත්මක වසරක් ලෙස 2021 හැඳින්විය හැකි අතර දුරස්ථ අධ්‍යාපන ක්‍රම සහ නිවසේ සිට වැඩකිරීමේ ක්‍රමය රටපුරා ක්‍රියාත්මක වීමත් සමග ලොව පුරා ව්‍යාප්ත වී පවතින දැනුම මෙම කලාපය වෙත රැගෙන ඒම සඳහා සහ ආසියානු කලාපයට අදාළ පාඩම් හා සාර්ථකත්වය පිළිබඳ විස්තර දැක්වීම් අවධාරණය කිරීම සඳහා දේශන, වැඩමුළු හා සිද්ධි අධ්‍යනයන් ද සංවිධානය කරමින් ක්‍රියාත්මක සැලැස්ම තුල පැවති පුහුණු වැඩසටහන් සියල්ල මාර්ගගත ක්‍රමය මගින් සාර්ථක අන්දමින් පැවැත්වීම සහ පළාත් පාලන ක්ෂේත්‍රයන්ට අදාළ කාලීන මාතෘකා පිළිබඳව අධ්‍යනය, පර්යේෂණ සහ උපදේශය සිදුකිරීමට සිය දායකත්වය සැපයීම ආයතනය විසින් සිදුකරන ලදී.

ආයතනය මගින් සපයනු ලබන පුළුල් පරාසයකින් යුතු සේවාවන් සමූහය ඔස්සේ, දැනුම,හැකියා සහ කුසලතා වර්ධනය සඳහා පහසුකම් සැපයීම මගින් තම සේවාදායක පිරිස තුළ ධාරිතා සංවර්ධනයක් ඇති කිරීම සඳහා සහ රාජ්‍ය අංශය තුළ පළාත් පාලන අවශ්‍යතා ඉටු කරගැනීමේදී යෝග්‍ය වන මැදිහත්වීම් සහ ක්‍රමෝපාය පිළිබඳව තීරණය කිරීම සඳහා බලවත් ප්‍රයත්නයක් දරන අතර ප්‍රාදේශීය සංවර්ධන ක්ෂේත්‍රය තුළ සියළුම

මට්ටම් තුළ දී වෘත්තීයමයභාවය ඉහළ නැංවීම සඳහා සියළුම පාර්ශ්වකරුවන්ගේ සක්‍රීය සහභාගිත්වය අපි බලාපොරොත්තු වෙමු. ආයතනයේ ඉලක්ක සපුරා ගැනීම සඳහා වටිනා මග පෙන්වීම් හා උපදෙස් වෙනුවෙන් ගරු කැබිනට් අමාත්‍යවරයා හා රාජ්‍ය අමාත්‍යවරයා වෙත විශේෂ ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කරගන්නා අතරම, පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ කාර්ය මණ්ඩලයටද අපි ස්තුතිවන්ත වෙමු.

1.7. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ සංවිධාන ව්‍යුහය

රූපසටහන 1.2



ICT/O තොරතුරු තාක්ෂණ නිලධාරී
IA අභ්‍යන්තර විගණක
TR භාෂා පරිවර්තක
PO වැඩසටහන් නිලධාරී
MO මාධ්‍ය නිලධාරී
MA කලමනාකරණ සහකාර
DR රියදුරු
KKS කාර්යාල කාර්ය සහායක

SI/T ජ්‍යෙෂ්ඨ උපදේශක පුහුණු
SI/R ජ්‍යෙෂ්ඨ උපදේශක පර්යේෂණ
AD/F සහකාර අධ්‍යක්ෂ මූල්‍ය
PS අධ්‍යක්ෂතුමාගේ පුද්ගලික සහකාර
PA වැඩසටහන් සහකාර

1.8 2021 වර්ෂය තුල සේවයේ නියුතු කාර්ය මණ්ඩලය





පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (SLILG), රේඛීය අමාත්‍යාංශය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු පවත්වන ලද සාකච්ඡා කිහිපයකින් අනතුරුව එහි 01/2017 කාර්ය මණ්ඩල සමාලෝචනයට අනුව ආයතනික අනුමත තනතුරු සංඛ්‍යාව සංශෝධනය කරන ලදී. නව තනතුරුද සහිතව මුළු තනතුරු සංඛ්‍යාව 51 ක් ලෙස අනුමත කරන ලද අතර ඊට අදාළ නව තනතුරු සඳහා බඳවා ගැනීම් පටිපාටි සැකසීම් කාර්යය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය(SLIDA) වෙත පැවරීම සිදුකොට ඇත.

පළාත් පාලන ආයතන ක්ෂේත්‍රය සඳහා වඩා කාර්යක්ෂම සහ සාධනීය සේවාවක් සැපයීම සහතික කිරීම පිණිස කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය සහ සිදුකරන කාර්යයන්ගේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍ය බව ආයතනය හඳුනාගෙන තිබෙන හෙයින් කාර්ය මණ්ඩලයේ දැනුම, කුසලතා සහ ආකල්ප ඉහළ නැංවීම සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් කාර්ය මණ්ඩල සංවර්ධනය සඳහා විවිධ වැඩසටහන් සංවිධානය කොට ඇත.

මේ සඳහා කාර්ය මණ්ඩලයට සිය ශක්‍යතා වැඩිදියුණු කර ගැනීම සඳහා ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී කරලීම සිදු කරනු ඇත.

1.9 **2021 වර්ෂය සඳහා ආයතනයේ සිටින කාර්ය මණ්ඩලය නම් සහ තනතුරු**

අංකය	නම	තනතුර
01	ජේ.ජේ.ලියනගේ මහතා (2021.09.30 දක්වා)	අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී
02	ආචාර්ය සුරතිස්ස දිසානායක මහතා (2021.10.07 සිට)	අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී
03	ආර්.එම්.ඒ.කේ. රත්නායක මහතා	උපදේශක (භෞතික සැලසුම්)
04	පී.එස්. ධර්මරත්න මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)
05	කේ.ඒ.පී.ආර්. කාරියප්පෙරුම මිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ (පුහුණු)
06	කුසල් ලොකුහෙට්ටි මහතා	අභ්‍යන්තර විගණක
07	පී.ඒ.ඩී. හිරාන් රදීෂ මහතා	සහකාර අධ්‍යක්ෂ (මුදල්)
08	ඒ.ඊ. සමරරත්න මහතා	පරිපාලන නිලධාරී
09	අංජන දොඩංගොඩ මහතා	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී
10	එස්.එන්.පී. රෝසා මිය	වැඩසටහන් නිළධාරී
11	ඩී.එම්. ජගත් පුෂ්පකුමාර මහතා	වැඩසටහන් නිළධාරී
12	ඒ.ඩී. වීරසේකර මිය	වැඩසටහන් නිළධාරී
13	එම්.ඩී.අයි.ඩී. විජේමාන්න මිය	වැඩසටහන් නිළධාරී
14	එස්.වයි. මහගොඩගේ මෙය	වැඩසටහන් නිළධාරී
15	පී.එච්.යූ. සඳමාලි මිය	වැඩසටහන් නිළධාරී
16	ආර්.ජී.පී.ඩී. ධර්මසිරි මෙය	මාධ්‍ය නිලධාරී
17	ඕ.ඩබ්.ටී.පී. ඕවිටිපාන මෙය	කළමනාකරණ සහකාර
18	එච්.ඩී.එම්. ප්‍රියදර්ශනී මෙය	කළමනාකරණ සහකාර
19	ඩී.එම්.ටී. රන්දුණු මිය	කළමනාකරණ සහකාර
20	එම්.එස්.සී. විමලවීර මෙය	කළමනාකරණ සහකාර
21	ඒ.පී. රත්නහේවා මිය	කළමනාකරණ සහකාර
22	එන්.පී. වික්‍රමනායක මිය	කළමනාකරණ සහකාර
23	ජේ.එච්.ජී. ටී.පෙරේරා මිය	කළමනාකරණ සහකාර
24	බී.ජී.සී.බී. කරුණාරත්න මහතා	රියැදුරු
25	එල්.එස්. සම්පත් මහතා	රියැදුරු
26	එන්.එච්.ඩී. තුෂාර මහතා	රියැදුරු
27	ආර්.ආර්.පී.ඩබ්. සුජත් බණ්ඩාර මහතා	රියදුරු
28	බී.ජී. ඩිංගිරි අම්මා මෙනවිය	කාර්යාල සහායක
29	එන්.එස්.ඩී. පෙරේරා මහතා	කාර්යාල සහායක
30	කේ. කමල් ක්‍රිෂාන්ත මහතා	කාර්යාල සහායක
31	ඒ.ඒ.එච්.එන්. අධිකාරි මහතා	කාර්යාල සහායක

වගුව 1.1

2.0. සැකැස්ම

2.1. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය හැඳින්වීම

පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට ජනතාව සඳහා වඩා කාර්යක්ෂම සහ සතුටුදායක සේවාවක් සැපයීමට හැකියාව නිර්මාණය වන පරිදි ඒවායේ ආයතනික පද්ධති සහ කළමනාකරණ විශිෂ්ඨත්වය වැඩි දියුණු කිරීම මෙම ආයතනයේ මූලික අභිමතාර්ථය වේ. 1987 වර්ෂයේදී 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හඳුන්වා දීමත් සමග පරිපාලනය බලතල විමධ්‍යගත කිරීම ආරම්භ විය. පරිපාලන බලතල පවරා දීම පිළිබඳ පරමාර්ථ මෙන්ම ප්‍රජාතන්තරවාදයේ මූලික අභිමතාර්ථද අත්පත් කර ගැනීම සඳහා ලැබී ඇති බලතල නිවැරදි ආකාරයට ක්‍රියාත්මක කළ යුතුය යන්න මෙහිදී අත්‍යවශ්‍ය සාධකයකි. ඒ අනුව, පළාත් සභා මට්ටමින් ආයතනික පරිපාලන භූමිකාවක් ස්ථාපිත කිරීමට අපේක්ෂා කරන ලදී.

ඉහතින් සඳහන් කොට ඇති පරිදි, පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය ස්ථාපිත කොට වසර 22 ක් ගත වී ඇත. මෙම කාලසීමාව අතරතුර ආයතනය විසින් වාර්ෂිකව කියා කළ යුතු වන සැළසුම් ක්‍රියාවට නංවා තිබෙන අතර ආයතනයේ පාලක සභාවේ මහපෙන්වීම යටතේ ආයතනයේ අරමුණු සහ අභිමතාර්ථ සාධනීය ආකාරයෙන් සංකල්පගත කොට නිර්මාණය කර ඇත. ඉතා කෙටි කාලසීමාවක් තුළ මෙලෙස සංකල්පගත කෙරුණු අරමුණු සහ අභිමතාර්ථ සාර්ථකව අත්පත් කර ගැනීමේදී ජාත්‍යන්තර පළාත් පාලන ආයතනවල මෙන්ම දේශීය පුහුණු ආයතනවලින්ද අනර්ඝ සහයෝගයක් ආයතනයට ලැබී ඇත. එසේම රේඛීය අමාත්‍යාංශය,අමාත්‍යතුමා හා ආයතනයේ කාර්යමණ්ඩලය ලබා දුන් දායකත්වයද ආයතනයේ පරමාර්ථ අත්පත් කර ගැනීමට මහෝපකාරී විය.කෙසේ වුවද, විමධ්‍යගත කිරීමේ වැඩසටහන, විශේෂයෙන්ම ක්‍රියාවට නැංවීමේ ක්‍රියාවලිය තුළදී අභිමාතර්ථවලින් යම් දුරස්ථ වීමක් පෙන්නුම් කරනු ලැබේ. මේ සඳහා පහත උදාහරණ දැක්විය හැකිය.

- විමධ්‍යගත කිරීම තුළින් ඇතිවන කාර්යක්ෂමභාවය ඉහළ යාම සහ කඩිනම් සහ ප්‍රමුඛ අවධානය යොමු විය යුතු සමාජ අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමේදී ඒ සඳහා සම්පත් බෙදී යාම සහතික කිරීම.
- ප්‍රතිපත්ති සම්පාදනය තුළදී විමධ්‍යගත කිරීමේ ප්‍රතිචාර දැක්වීම ඉහළ නැංවීමේ හැකියාව සහ ඉලක්ක කණ්ඩායම් වල අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- දරිද්‍රතාව අවම කිරීමේදී සහ සංවර්ධන ක්‍රියාකාරකම් වලදී විමද්‍යගත කිරීමෙන් ලැබෙන සාධනීය බලපෑම

- විශේෂයෙන්ම දරිද්‍රතාවයට ලක් ව සිටින ජනතාව සහ පුරවැසියන් කෙරෙහි දක්වන ඉහළ ප්‍රමුඛතාවය පිළිබිඹු වන අන්දමින් මෙම මට්ටම්වලදී ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම
- බිම් මට්ටමේ සිටින ප්‍රජාවගේ ජීවන තත්ත්වයන් වැඩි දියුණු කිරීම සඳහා එම ප්‍රජාවන්හි මැදිහත්වීමද සහිතව තීරණ ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම.

2.2. ආයතනික පාලන ප්‍රකාශනය

ආයතන නාමය	: පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (1999 අංක 31 දරන පාර්ලිමේන්තු පනතින් සංස්ථාපනය කරන ලදී.)
මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද දිනය	: 15.10.1999
ලියාපදිංචි කාර්යාලය	: අංක 17, මලලසේකර මාවත, කොළඹ 07
විගණකවරු	: විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව
බැංකුකරුවන්	: ලංකා බැංකුව, නිදහස් චතුරශ්‍ර ශාඛාව, කොළඹ 07.
විදේශීය සංගම්	: පොදු රාජ්‍ය මන්ඩලීය පළාත් පාලන සංසදය (CLGF) ආසියා සහ ශාන්තිකර කළාපීය පළාත් පාලන පුහුණු සහ පර්යේෂණ ජාලය (LOGOTRI)
දේශීය සංගම්	: United Nations Development Fund (UNDP) UN HABITAT CHRYSALIS One Text Initiative -OTI Search for Common Ground -SFCG The Asia Foundation

2.3. පාලක සභාවේ සාමාජිකයන්

1999 අංක 31 දරන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනතේ 5 (1) (අ)සහ (ආ) හි සඳහන් නියමයන් ප්‍රකාරව ගරු අමාත්‍යවරයා විසින් නිල බලයෙන් පත් කරනු ලැබූ සාමාජිකයන් 08 දෙනෙකු සහ පනතේ විධිවිධාන ප්‍රකාරව පත් කරනු ලැබූ තවත් සාමාජිකයන් 05 දෙනෙකු ඇතුළුව සාමාජිකයන් 13 දෙනෙකුගෙන් පාලක සභාව සමන්විත වේ.

පනතේ 5 (1) (අ) අනුව 2021 වර්ෂයේ පාලක මණ්ඩලයේ සිටි,නිල බලයෙන් පත් කල සාමාජිකයන් සහ පත්කර ගනු ලැබූ සමාජිකයන් පහත පරිදි වේ.

<u>2021 වසරේ පාලක මණ්ඩල සභාපතිවරුන්</u>

- **එස්.ඩී.ඒ.බී.බොරලැස්ස ,මහතා (2021 ඔක්තෝම්බර් දක්වා)**
  ලේකම්
  පළාත් සභා සහ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ
  අමාත්‍යාංශය

- **ඩබ්.එම්.එම්.බී.වීරසේකර මහතා (2021 දෙසැම්බර්)**
  ලේකම්

  පළාත් සභා සහ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ
  අමාත්‍යාංශය

<u>නිල බලයෙන් පත්කරන ලද සාමාජිකයන්</u>

- **සිරිනිමල් පෙරේරා මහතා**
  ලේකම්

  නාගරික සංවර්ධන ,වෙරල සංරක්ෂණ ,අපද්‍රව්‍ය බැහැර කිරීම් හා සමාජ පවිත්‍රතා
  අමාත්‍යාංශය

- **එම්.එම්.එස්.බී.යාලේගම මහතා**
  අතිරේක ලේකම්
  නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

- **අනෝජා පී.ගුරුගේ මිය**

  අතිරේක ලේකම්
  බුද්ධ ශාසන ,ආගමික සහ සංස්කෘතික අමාත්‍යාංශය

- **කේ.ඩී.එන්.රංජිත් අසෝක මහතා**
  අතිරේක ලේකම් (මානව සම්පත් සහ සංවර්ධන) ,
  මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

- **මහාචාර්ය ශිරන්ත හීන්කෙන්ද මහතා**
  පීඨාධිපති, මානව සහ සමාජ විද්‍යා පීඨය
  ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

- **ඩී.එල්.ඒ.ආර්.ඩී.ජයසිංහ මහතා**
  - නියෝජ්‍ය අධ්‍යක්ෂ
  බාහිර සම්පත් දෙපාර්තමේන්තුව
  මුදල් අමාත්‍යාංශය

- **ආර්.ඒ.ආර්.ආර්.රූපසිංහ මහතා**
  අතිරේක ලේකම් ,පරිසර අමාත්‍යාංශය

<u>පත් කරනු ලැබූ සාමාජිකයන්</u>

- **චම්පිකා දිල්හානි අමරසේකර මිය -නීතීඥ**
  සාමාජික

- **ජයන්ති සිල්වා රොද්‍රිගෝ මිය- නීතීඥ**
  සාමාජික

- **දර්ශන ජයන්ත පතිරණ මහතා**
  සාමාජික

- **මහින්ද පාලිත දන්ගම්පල මහතා**
  සාමාජික

- **අමිල රන්මන්ඩල මහතා**
  සාමාජික

- **ජයන්ත ලියනගේ මහතා**
  කැඳවුම්කරු
  අධ්‍යක්ෂ /ප්‍රධාන විධායක නිලධාරී -පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

- **ආචාර්ය සුරතිස්ස දිසානායක මහතා** කැඳවුම්කරු
  අධ්‍යක්ෂ /ප්‍රධාන විධායක නිලධාරී -පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

ආයතනයේ ක්‍රියාකාරිත්වය සහ කළමනාකරණය ආශ්‍රිත සියළු තීරණ ගැනීම පාලක සභාව විසින් සිදු කරන අතර විනය බලධරයා වන්නේ ද ආයතනයේ පාලක සභාවයි. මෙම පාලක සභාව සංස්ථාපිත පනත මගින් නියම කළ අමාත්‍යාංශයවල ලේකම්වරුන් සහ විවිධ වෘත්තීය නියෝජිතයන්ගෙන් සමන්විත වේ. පාලක සභාවේ සභාපතිවරයා වනුයේ පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්වරයාය.

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ අධ්‍යක්ෂකවරයා, පාලක සභාවේ කැඳවුම්කරු මෙන්ම ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා ද වේ. ඔහු කටයුතු කරනුයේ පාලක සභාවේ සමස්ත මහපෙන්වීම යටතේය. අතිරේක අධ්‍යක්ෂකවරු, උපදේශකවරු, නියෝජ්‍ය අධ්‍යක්ෂකවරු ,සහකාර අධ්‍යක්ෂ (මුදල්) සහ සහායක කාර්ය මණ්ඩලයෙන්ද අධ්‍යක්ෂකවරයාට සහාය සැලසේ.

2.3.1 2021 වර්ෂයේ පැවති පාලක මණ්ඩල රැස්වීම්

	පාලක සභා සාමාජිකයන්ගේ නම්	පාලක සභාවේ දරණ තනතුර	රැස්වීම් අංක **169** 2021 ජුනි 18	රැස්වීම් අංක **170** 2021 අගෝස්තු 06	රැස්වීම් අංක **171** 2021 ඔක්තෝබර් 11	රැස්වීම් අංක **172** 2021 නොවැම්බර් 11	රැස්වීම් අංක **173** 2021 දෙසැම්බර් 13	මුළු දින ගණන
01	එස්.ඩි.ඒ.බී.බොරලැස්ස මහතා, ලේකම් ,පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය	සභාපති	පැමිණ ඇත	පැමිණ ඇත	පැමිණ ඇත	පැමිණ නැත	-	03
02	ඩබ්.එම්.එම්.බී.වීරසේකර මහතා, ලේකම් ,පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය	සභාපති	-	-	-	-	පැමිණ ඇත	01
03	කේ.ඩී.එන්.රංජිත් අසෝක මහතා අතිරේක ලේකම් (මානව සම්පත් සහ සංවර්ධන) රාජ්‍ය සේවා ,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	සාමාජික	-	පැමිණ ඇත	පැමිණ ඇත	පැමිණ ඇත	පැමිණ ඇත	04
04	සිරිනිමල් පෙරේරා මහතා, ලේකම් ,නාගරික සංවර්ධන ,වෙරල සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරකිරීම් හා සමාජ පවිත්‍රතා අමාත්‍යාංශය	සාමාජික	පැමිණ ඇත	පැමිණ නැත	පැමිණ නැත	පැමිණ ඇත	-	02
05	එම්.එම්.එස්.බී.යාලේගම අතිරේක ලේකම් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය	සාමාජික	-	-	-	පැමිණ ඇත	පැමිණ ඇත	02
06	අනෝජා .පී ගුරුගේ මිය අතිරේක ලේකම් , බුද්ධශාසන ,ආගමික	සාමාජික	පැමිණ ඇත	පැමිණ නැත	පැමිණ ඇත	පැමිණ ඇත	පැමිණ නැත	03

	සහ සංස්කෘතික අමාත්‍යාංශය							
07	මහාචාර්‍ය ශිරන්ත හීන්කෙන්ද මහතා පීඨාධිපති,මානව සහ සමාජ විද්‍යා පීඨය,ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	සාමාජික	පැමිණ ඇත	පැමිණ ඇත	පැමිණ ඇත	පැමිණ ඇත	පැමිණ ඇත	05
08	ඩී.එල්.ඒ.ආර්.ඩී.ජයසිංහ මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ බාහිර සම්පත් දෙපාර්තමේන්තුව , මුදල් අමාත්‍යාංශය	සාමාජික	පැමිණ ඇත	පැමිණ නැත	පැමිණ ඇත	පැමිණ ඇත	පැමිණ ඇත	04
09	ආර්.ඒ.ආර්.ආර්.රූපසිංහ අතිරේක ලේකම් ,පරිසර අමාත්‍යාංශය	සාමාජික	-	-	පැමිණ ඇත	පැමිණ ඇත	පැමිණ ඇත	03
10	චම්පිකා දිල්හානි අමරසේකර මිය -නීතීඥ	සාමාජික	-	-	පැමිණ ඇත	පැමිණ ඇත	පැමිණ ඇත	03
11	ජයන්ති සිල්වා රොද්‍රිගෝ මිය -නීතීඥ	සාමාජික	-	-	පැමිණ ඇත	පැමිණ නැත	පැමිණ ඇත	02
12	දර්ශන ජයන්ත පතිරණ මහතා	සාමාජික	-	-	පැමිණ ඇත	පැමිණ නැත	පැමිණ නැත	01
13	මහින්ද පාලිත දන්ගම්පල මහතා	සාමාජික	-	-	පැමිණ ඇත	පැමිණ ඇත	පැමිණ නැත	02
14	අමිල රන්මන්ඩල මහතා	සාමාජික	-	-	පැමිණ ඇත	පැමිණ ඇත	පැමිණ ඇත	03
15	ජයන්ත ලියනගේ මහතා අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය	කැඳවුම්කරු	පැමිණ ඇත	පැමිණ ඇත	-	-	-	02
16	ආචාර්ය සුරතිස්ස දිසානායක මහතා අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය	කැඳවුම්කරු	-	-	-	පැමිණ ඇත	පැමිණ නැත	01
			06	04	11	12	10	

වගුව 2.1

2.4. විගණන සහ කළමනාකරණ කමිටු සාමාජිකයන්

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ 2021 වසරේ විගණන සහ කළමනාකරණ කමිටුව පහත සාමාජිකයන්ගෙන් සැදුම්ලත් වේ.

- ඩී.එල්.ඒ.ආර්.ඩී. ජයසිංහ මහත්මිය - ***සභාපති***
  නියෝජ්‍ය අධ්‍යක්ෂක - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව,මුදල් අමාත්‍යාංශය

- කේ.ඩි.එන්.රන්ජිත් අශෝක මහතා - ***සාමාජික***
  අතිරේක ලේකම්- රාජ්‍ය සේවා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

- අනෝජා ගුරුගේ මහත්මිය - ***සාමාජික***
  අතිරේක ලේකම් - බුද්ධ ශාසන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

බාහිර නිරීක්ෂකයන්

- අශෝක ධනපාල මහතා

  විගණන අධිකාරී- විගණකාධිපති දෙපාර්තමේන්තුව

- ඩබ්.පි.විතාරණ
  ප්‍රධාන අභ්‍යන්තර විගණක - පළාත් සභා සහ පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය

කැඳවුම්කරු

- කුසල් ලොකුහෙට්ටි මහතා

  අභ්‍යන්තර විගණක - පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ කාර්ය මණ්ඩලයේ සහභාගිත්වය

- ජයන්ත ලියනගේ මහතා (2021 සැප්තැම්බර් වන තෙක්)
  ප්‍රධාන විධායක නිලධාරී - පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

- ආචාර්ය ඩී.එම්.සුරතිස්ස මහතා (2021 ඔක්තෝබර් සිට)
  ප්‍රධාන විධායක නිලධාරී - පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

- හිරාන් රදීෂ මහතා
  සහකාර අධ්‍යක්ෂක (මුල්‍ය) - පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

- අසේල සමරරත්න මහතා
  පරිපාලන නිලධාරී - පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

2.5 2021 වර්ෂයේ පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයන්ගේ නම්	කමිටුවෙහි දරන ලද තනතුර	විගණන කමිටු රැස්වීම් දින		පැමිණි දින ගණන
		රැස්වීම් අංක 47	රැස්වීම් අංක 58 2021 නොවැම්බර් 09	
ඩී.එල්.ඒ.ආර්.ඩී. ජයසිංහ මහත්මිය නියෝජ්‍ය අධ්‍යක්ෂක - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව , මුදල් අමාත්‍යාංශය සහ පාලක මණ්ඩල සාමාජික	**සභාපති**			02
කේ.ඩී.එන්.රන්ජිත් අශෝක මහතා අතිරේක ලේකම්- රාජ්‍ය සේවා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ පාලක මණ්ඩල සාමාජික	**සාමාජික**			02
අනෝජා ගුරුගේ මහත්මිය අතිරේක ලේකම් - බුද්ධ ශාසන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ පාලක මණ්ඩල සාමාජික	**සාමාජික**			02
අශෝක ධනපාල මහතා විගණන අධිකාරී- විගණකාධිපති දෙපාර්තමේන්තුව	නිරීක්ෂක			02
ඩබ්.පී.විතාරණ ප්‍රධාන අභ්‍යන්තර විගණක - පළාත් සභා සහ පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය	නිරීක්ෂක			02
කුසල් ලොකුහෙට්ටි අභ්‍යන්තර විගණක - පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය	කැඳවුම්කරු			02

3.0. ආයතනයේ බලවරම සහ පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල කාර්යසාධනය වැඩි දියුණු කිරීම සඳහා ආයතනය සතු භූමිකාව සමාලෝචනය කිරීම

3.1. හැඳින්වීම

1987 වර්ෂයේදී 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හඳුන්වා දීමත් සමග පරිපාලනය බලතල විමධ්‍යගත කිරීම ආරම්භ විය. පරිපාලන බලතල පවරා දීම පිළිබඳ පරමාර්ථ මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික අභිමතාර්ථද අත්පත් කර ගැනීම සඳහා ලැබී ඇති බලතල නිවැරදි ආකාරයට ක්‍රියාත්මක කළ යුතුය යන්න මෙහිදී අත්‍යවශ්‍ය සාධකයකි. ඒ අනුව, පළාත් සභා මට්ටමින් ආයතනික පරිපාලන භූමිකාවක් ස්ථාපිත කිරීමට අපේක්ෂා කරන ලදී. පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ජනතාව සඳහා වඩා කාර්යක්ෂම සහ සතුටුදායක සේවාවක් සැපයීමට හැකියාව නිර්මාණය වන පරිදි ඒවායේ ආයතනික පද්ධති සහ කළමනාකරණ විශිෂ්ඨත්වය වැඩි දියුණු කිරීම මෙම ආයතනයේ මූලික අභිමතාර්ථය වේ.

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය ස්ථාපිත කොට වසර 22 ක් ගත වී ඇති මෙම කාලසීමාව අතරතුර ආයතනය විසින් වාර්ෂිකව ක්‍රියාත්මක කළ යුතු වන සැළසුම් ක්‍රියාවට නංවා තිබෙන අතර ආයතනයේ පාලක සභාවේ මහපෙන්වීම යටතේ ආයතනයේ අරමුණු සහ අභිමතාර්ථ සාධනීය ආකාරයෙන් සංකල්පගත කොට නිර්මාණය කර ඇත. ඉතා කෙටි කාලසීමාවක් තුළ මෙලෙස සංකල්පගත කෙරුණු අරමුණු සහ අභිමතාර්ථ සාර්ථකව අත්පත් කර ගැනීමේදී ජාත්‍යන්තර පළාත් පාලන ආයතනවල මෙන්ම දේශීය පුහුණු ආයතනවලින්ද අනර්ඝ සහයෝගයක් ආයතනයට ලැබී ඇත. එසේම ආයතනයේ කාර්යමණ්ඩලය ලබා දුන් දායකත්වයද ආයතනයේ පරමාර්ථ අත්පත් කර ගැනීමේදී මහෝපකාරී විය.

2018 වර්ෂයේ පශ්චාත් භාගයෙන් ආරම්භ වූ දේශපාලන අස්ථාවරත්වය අනතුරුව 2019 වර්ෂයේ මැද භාගය තුල සිදු වූ අන්තවාදී ත්‍රස්ත ප්‍රහාරය හේතුවෙන් රට තුල අනපේක්ෂිත තත්ත්වයක් උද්ගත වූ අතර අනතුරුව ගෝලීය වසංගත තත්වයක් වූ කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ වුවද ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූ පුහුණුව, පර්යේෂණය, උපදේශනය හා තොරතුරු බෙදා හැරීමේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑමට කටයුතු කරන ලදී. විශේෂයෙන්ම මාර්ගගත ක්‍රමය යටතේ ඉගැන්වීම් කටයුතු පවත්වාගෙන යාම අඛන්ඩව සිදුකරන ලදී.

සිය ආයතනික අභිමතාර්ථයන් ඉටුකර ගැනීම සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය 1999 අංක 31 දරණ සංස්ථාපිත පනත මගින් ලබාදී තිබෙන බලවරම අනුව පහත සඳහන් කටයුතු සිදුකරනු ලැබේ.

- ජාතික මට්ටමේ / පළාත් මට්ටමේ පුහුණු වැඩසටහන් හා වැඩමුළු පැවැත්වීම
- මහජන නියෝජිතයන් සඳහා ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම
- නිලධාරීන් සඳහා ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම
- සහතිකපත්‍ර පාඨමාලා පැවැත්වීම
    I. ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
    II. පළාත් පාලන ආයතන වල විමර්ශන නිලධාරීන් සඳහා සහතිකපත්‍ර පාඨමාලාව
    III. පරිගණක යෙදවුම් පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලා
    IV. පළාත් පාලනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව (උෟව පළාත)
- ප්‍රායෝගික භාවිතයන් පිළිබඳ පහුණු සැසි පවත්වීමට කටයුතු කිරීම
    I. අතුරු නීති පිළියෙළ කිරීම
    II. පළාත් පාලන ආයතන වල අවසන් ගිණුම් වාර්තා පිළියෙළ කිරීම
- විවිධ විෂය මාතෘකාවන් ඔස්සේ පර්යේෂණ පැවැත්වීම හා එම වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.
- පළාත් පාලන ක්ෂේත්‍රය තුල ප්‍රධාන අංශ 08 යටතේ උපදේශන සේවා සැපයීමට කටයුතු කිරීම.
- ජාතික හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ පැවැත්වීම
- සෑම මාස දෙවරකට වරක් පළාත් පාලන සගරාව ප්‍රකාශයට පත්කිරීම හා වාර්ෂිකව පළාත්
  පාලන ජර්නලය පළ කිරීමට කටයුතු කිරීම.
- අත්පොත් හා අත් පත්‍රිකා ප්‍රකාශයට පත්කිරීම.

3.2 ඉලක්කගත කණ්ඩායම

මෙම ආයතනය විසින් සිදු කරනු ලබන පුහුණුව , පර්යේෂණ , උපදේශනය හා තොරතුරු බෙදා හැරීම නම් වූ සිවු වැදෑරුම් කාර්යයන්හි ප්‍රතිලාභීන් වන්නේ ශ්‍රී ලංකාවේ පළාත් 09 තුල ක්‍රියාත්මක පළාත් සභා හා පළාත් පාලන ආයතන සඳහා තෝරා පත් කර ගනු ලබන මහජන නියෝජිතයන් හා නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලය වේ.

2021 වන විට පළාත් පාලන ආයතන සංඛ්‍යාව 341 ක්ව පැවති අතර එය මහ නගර සභා 24, නගර සභා 41 සහ ප්‍රාදේශීය සභා 276 ලෙස ව්‍යාප්තව පැවතුනි. සියළුම පළාත් පාලන ආයතන සඳහා සාමාජිකයන් තෝරා ගැනීම මිශ්‍ර මැතිවරණ ක්‍රමයක් මගින් සිදුකරනු ලබන අතර, එක් මැතිවරණයකදී ආසන්න වශයෙන් මහජන නියෝජිතයන් 8,500 පමණ පත්කර ගන්නා අතර පළාත් පාලන ආයතන යනු මහජනතාව වෙත ප්‍රාදේශීය සේවාවන් ඉටු කර දෙන මූලික සේවා

සැපයීමේ ආයතන වන බැවින්, වර්තමාන යහ පාලන රජයේ කැපවීම් සහගත ප්‍රතිපත්ති සම්බන්ධයෙන් මනා අවබෝධයක් සහ දැනුවත්භාවයක් සහිතව තීරණ ගැනීමත් විනිවිදභාවය සහ වගවීම අවධාරණය කිරීමත් සහිකයින්ගේ කාර්යභාරය වේ.

තවද කාර්යාලීය නිලධාරීන්, ක්ෂේත්‍ර නිලධාරීන් හා අනෙකුත් නිලධාරීන් ලෙස 50,000 පමණ කාර්ය මණ්ඩල ධාරිතාවයක් පළාත් පාලන ක්ෂේත්‍රය තුළ සේවය කරන අතර එක් එක් ඉලක්කගත කණ්ඩායම් වර්ගයන් එකිනෙකින් වෙනස් වන අතර, පළාත් කළමනාකරණ ඒකක සමග සිදු කරනු ලබන පුහුණු අවශ්‍යතා විශ්ලේෂණයන් සහ සාකච්ඡා තුලින් හඳුනාගත් අවශ්‍යතාවයන්ට ගැලපෙන ආකාරයට පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම සිදු කෙරේ. පළාත් මට්ටමෙන් පලාත් පුහුණු ඒකක හා ඒකාබද්ධ වෙමින් පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම හා පැවැත්වීම සම්බන්ධයෙන් ආයතනය සුවිශාල භූමිකාවක් ඉටු කරනු ලැබේ.

ඒ ආකාරයට, සෑම වසරකම ඉලක්කය වන්නේ පළාත් පාලන ආයතන සහ පළාත් සභා විසින් ඉටු කිරීමට කැප වී සිටින පළාත් මට්ටමේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලීන් කෙරෙහි යොමුවන ආකාරය පෙන්වා දීම සහ ඒ අනුව පළාත් පාලන ආයතන සහ පළාත් සභාවන්හි ශක්‍යතා වර්ධන ක්‍රියාවලිය නිසි පරිදි පෙළගැස්වීමයි.

පළාත් පාලන ආයතන බෙදී යාම පහත පරිදි වේ.

පළාත	දිස්ත්‍රික්කය	මහානගර සභා ගණන	නගර සභා ගණන	ප්‍රාදේශීය සභා ගණන	මුළු එකතුව
බස්නාහිර	කොළඹ	06	05	03	14
	ගම්පහ	01	05	12	18
	කළුතර	00	04	13	17
වයඹ	කුරුණෑගල	01	01	19	21
	පුත්තලම	00	02	10	12
මධ්‍යම	මහනුවර	01	04	17	22
	මාතලේ	02	00	11	13
	නුවර එළිය	01	02	09	12
සබරගමුව	කෑගල්ල	00	01	11	12
	රත්නපුර	01	02	14	17
ඌව	බදුල්ල	02	01	15	18
	මොනරාගල	00	00	10	10
උතුරු මැද	අනුරාධපුරය	01	00	17	18
	පොලොන්නරුව	01	00	07	08
දකුණු	ගාල්ල	01	02	17	20
	මාතර	01	01	15	17
	හම්බන්තොට	01	01	10	12
උතුරු	යාපනය	01	03	14	18
	කිලිනොච්චි	00	00	03	03
	මන්නාරම	00	01	04	05
	වව්නියාව	00	01	04	05
	මුලතිවු	00	00	04	04
නැගෙනහිර	අම්පාර	02	01	17	20
	ත්‍රිකුණාමලය	00	02	11	13
	මඩකලපුව	01	02	09	12
එකතුව					**341**

වගුව 3.1

3.3 සම්බන්ධීකරණය සහ අධීක්ෂණය

පළාත් කළමනාකරණ සංවර්ධන ඒකක මගින් සහ පළාත් පාලන කොමසාරිස්වරුන් විසින් පවත්වනු ලබන පුහුණුවීම් කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම මෙම ආයතනය විසින් සිදු කරන වැදගත් කාර්ය භාරයක් වශයෙන් සැලකේ. මෙම ක්‍රියාකාරකම් වල ප්‍රගතිය සමාලෝචනයට ලක් කරනු ලබන්නේ පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකක සහ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් පවත්වනු ලබන මාසික සමාලෝචන රැස්වීම් මගින් ය.

3.4 ව්‍යාපාර ප්‍රවර්ධනය

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය සතු පසුගිය අත්දැකීම් වලින් පෙනී ගොස් ඇත්තේ විවිධ රාජ්‍ය ආයතන මෙන්ම රාජ්‍ය නොවන සංවිධාන බොහොමයක් ඒවායේ පළාත් පාලනය පිළිබඳ විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පළාත් පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනයේ සහාය අපේකෂා කරන බවයි. ප්‍රතිපල කෙරෙහි නැඹුරු වූ ව්‍යාපෘති හඳුනාගැනීම සඳහා මෙහිදි සියළුම ක්‍රියාකාරකම් යම් තෝරා බේරාගැනීමකට ලක් කිරීම අවශ්‍ය වේ. මෙම ව්‍යාපාර ප්‍රවර්ධන කටයුතු SLILG හි අධ්‍යක්ෂවරයාගේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ. අදාළ ආයතන සමගින් සාකච්ඡා කිරීමෙන් අනතුරුව පාලක සභාවේ ද අනුමැතිය ලබා ගෙන මෙම වැඩසටහන් යෝග්‍ය පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂකවරයා විසින් අවශ්‍ය පියවර ගෙන ඇත.

3.5 ජාතික/ ජාත්‍යන්තර පුහුණු සහ අධ්‍යාපන ආයතන සමඟ සබඳතා

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය ජාතික මෙන්ම ජාත්‍යන්තර ආයතන සමඟ සම්බන්ධ වී පවතී. මෙම සම්බන්ධතාවයන් පවත්වාගෙන ගොස් ඇත්තේ අදාළ දෙපාර්ශ්වයන්ට ප්‍රතිලාභ ලැබෙන ආකාරයකිනි. එසේ ඇති කර ගන්නා ලද සබඳතාවයන් මඟින් විදේශ පුහුණු අවස්ථා ලබා ගැනීම සඳහා වන ඉඩකඩ වැඩි කිරීමට පහසුකම් සලසා ඇත.


USAID, UN-HABITAT, UNDP, CHRYSALIS, DFAT-ඕස්ට්‍රේලියාව,ලෝක බැංකුව සහ යුරෝපීය සංගමය යනාදී සංවිධාන සමගින් තොරතුරු හුවමාරු කර ගැනීම පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ අපේක්ෂාව වේ.

3.6 පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ සංවිධාන පරිසරය


පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල කාර්යසාධනය වැඩි දියුණු කිරීම උදෙසා ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන මෙම ආයතනයද සංවිධාන පරිසරයන්හි පවත්නා සාධකයන්හි වෙනස්වීම වල බලපෑමට නිතැතින් ලක් වේ. පරිසරය තුල නිසි පරිදි ක්‍රියාත්මක වෙමින් ආයතනික අරමුණු හා වගකීම් මනා ලෙස ඉටු කිරීම පිණිස පහත සඳහන් සාධකයන් කෙරෙහි සැලකිල්ලෙන් කටයුතු කිරීම ආයතනය විසින් ඉටුකරනු ලැබේ.

- දේශපාලනමය සාධකයන්
- ආර්ථිකමය සාධකයන්
- සමාජ - සංස්කෘතික සාධකයන්
- තාක්ෂණික සාධකයන්
- නීතිමය සාධකයන්
- පාරිසරික සාධකයන්

3.7 පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ ඇල්මැති පාර්ශවයන්හි ව්‍යුහය



1.පළාත් සභා හා එහි නිලධාරීන්
2.පළාත් පාලන ආයතන හා එහි නිලධාරීන්
3.ප්‍රාදේශීය දේශපාලකයින්
4.භාහිර අධ්‍යන කාර්යමණ්ඩලය
5.සහභාගිවන්නන් හා පුහුණුලාභීන්
6.සේවා සපයන්නන්
7.ජාතික හා ජාත්‍යන්තර පුහුණු ආයතන
8.ව්‍යවස්ථාපිත ආයතන
9.අරමුදල් සම්පාදීත ආයතන
10.ව්‍යාපාරික ප්‍රජාව
11.මාධ්‍යය ආයතන



1.ආයතනික නිලධාරීන්
2.ආයතනික උපදේශකයන්
3.වෘත්තීය සංගම්
4.පාලක මණ්ඩලය හා අනෙකුත් කමිටු
5.අමාත්‍යතුමා හා රේඛීය අමාත්‍යාංශය

ජාතික මට්ටමේ පුහුණු ආයතනයක් ලෙස සිය ක්‍රියාකාරිත්වය තුල ගනු ලබන තීරණයන් ආයතනය සම්බන්ධයෙන් ඇල්මක් දක්වන පාර්ශවයන් වෙත බලපෑමක් ඇති කිරීම මෙන්ම, එම ඇල්මැති පාර්ශවයන් වෙතින් ආයතනයේ ක්‍රියාකාරිත්වයට බලපෑමක් ඇතිවන බව පිළිබඳ ආයතනය නිරන්තර අවබෝධයෙන් සිටී. ඒ අතුරෙන් අභ්‍යන්තර ඇල්මැති පාර්ශවයන් ලෙස අමාත්‍යාංශය, අමාත්‍යතුමා , පාලක මණ්ඩලය , අධ්‍යන කාර්ය මණ්ඩලය , අභ්‍යන්තර සේවක මණ්ඩලය සෘජු ලෙසම සම්බන්ධවන ඇල්මැති පාර්ශවයන් ලෙස සුවිශාල බලපෑමක් ඇති කරනු ඇත.

ආයතනයක් ලෙස පළාත් පාලන ආයතන වල කාර්යසාධනය වැඩි දියුණු කිරීම සඳහා ආයතනනික භූමිකාව තවදුරටත් පුළුල් කරමින් හා සක්‍රීය දායකත්වයක් දැක්වීම සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පහත සඳහන් ක්‍රියාමාර්ග අනාගතය තුල ගැනීම කෙරෙහි නැබුරුව පවතී.

- වඩාත් යාවත්කාලීන හා අදාලත්වයෙන් යුතු ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහන් ලබාදීමට හැකිවන පරිදි ආයතනය තුල අඛණ්ඩ අධ්‍යන හා වෘත්තීය කාර්යමණ්ඩල සංචිතයක් ඇති කිරීම හා පවත්වාගෙන යාම.

- රාජ්‍ය සේවය හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වඩාත් ප්‍රයෝජනවත් පර්යේෂණ පැවැත්වීමේ හැකියාවන් තවදුරටත් වර්ධනය කිරීම.

- ආයතනය පිළිබඳව වඩාත් ධනාත්මක ප්‍රතිරූපයක් සේවාලාභීන් තුල ඇතිවන ආකාරයට ආයතනික යටිතල පහසුකම් වර්ධනය කිරීම, නව තාක්ෂණය හඳුන්වාදීම හා වඩාත් සුදුසු ඉගැනුම් පරිසරයක් නිර්මාණය කිරීම.

- සිය සේවාලාභීන හා අනෙකුත් පාර්ශවයන් සමග වඩාත් සුහවාදී හා ශක්තිමත් සම්බන්ධතාවයක් ඇතිකරගැනීම හා පවත්වාගෙන යෑමට කටයුතු කිරීම.

- ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ඉලක්ක වෙළඳපොල ආමන්ත්‍රණය සඳහා වූ ආකර්ශනීය ආයතනික සන්නම් නාමයක් ලෙස වර්ධනය වීම.

- තාක්ෂණික හුවමාරුව හා ඩිජිටල් දැනුම හුවමාරු කර ගැනීම සඳහා විදේශ ආයතන සමග මනා සම්බන්ධතාවය ගොඩනගා ගැනීම.

3.8 පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ විශේෂ අවස්ථා

ආචාර්ය සුරතිස්ස දිසානායක මහතා අධ්‍යක්ෂ, ප්‍රධාන විධායක නිලධාරී ලෙස රාජකාරී භාර ගැනීම



පස් අවුරුදු (2021-2025) සැලැස්ම ඉදිරිපත් කිරීම





ඩිප්ලෝමා සහතික පත්‍ර ප්‍රධාන උත්සවය -2021



නැගෙනහිර පළාතේ පළාත් පාලන ආයතන වල නිලධාරීන් සඳහා පවත්වන ලද පුහුණු වැඩමුළුව – ලයා ලෙෂර් හෝටලය ,කුකුලේගහ හිදී



සේවක මණ්ඩලය වෙනුවෙන් පවත්වන ලද ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන -ලයා ලෙෂර් හෝටලය ,කුකුලේගහ හිදී





4.0 2021 වර්ෂය තුළ ආයතනයේ සමස්ත කාර්යසාධනය

4.1. 2021 වර්ෂය තුළ පළාත් සභා හා පළාත් පාලන මට්ටමෙන් පවත්වන ලද කෙටි කාලීන පුහුණු වැඩසටහන්

වගුව 1

අංශය	පුහුණු වැඩසටහන	පැවැත්වීමට සැලසුම් කළ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	පැවැත්වූ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	අපේක්ෂිත පුහුණු ලාභීන් ගණන	පුහුණු ලාභීන් සංඛ්‍යාව
ඉංජිනේරු අංශය	වාහන නඩත්තුව පිළිබඳ පුහුණු වැඩසටහන	9	3	220	150
	විදුලිය ඉතිරි කිරීම / නඩත්තුව ගණනය කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන	9	5	220	250
	පළාත් මට්ටමේ පුහුණු අවශ්‍යතා මත සිදු කළ වැඩසටහන්	6	2	150	100
පර්යේෂණ හා සංවර්ධන අංශය	පළාත් පාලන ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ අධ්‍යනය	01	-	-	-
	පුහුණු සම්බන්ධීකරණය ,පුහුණු ඇගයීම ,පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම හා පුහුණු සැලැස්ම සැකසීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව	08	06	100	93
	විමර්ෂණ නිලධාරීන් උදෙසා මාර්ගගත ක්‍රමය ඔස්සේ පැවැත්වූ විමර්ෂණ ක්‍රියාවලිය පිළිබඳ වැඩමුළුව	01	01	120	70
පොදු කළමනාකරණ අංශය	විනය කාර්ය පටිපාටිය පිළිබඳ පුහුණු වැඩමුළුව	09	09	220	210
	ආකල්ප වර්ධනය සහ ධනාත්මක සිතුවිලි ඇති කර ගැනීම පිළිබඳ පුහුණු වැඩමුළුව	09	09	200	181
	සන්නිවේදන කුසලතා හා ගැටුම් කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව	09	09	220	175

භෞතික සැලසුම් හා පරිසර අංශය	භෞතික සැලසුම් හා ආදායම් ප්‍රවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන	09	09	250	398
	පරිසර බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහන	09	09	250	310
	පළාත් පාලන ආයතන මට්ටමින් ආපදා ආදායම් අවම කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන	9	9	250	280
	ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමට අදාළ නීති පිළිබඳ පුහුණු වැඩමුළුව	9	9	450	407
මූල්‍ය කළමනාකරණ අංශය	පළාත් පාලන ආයතන සඳහා අවසන් ගිණුම් සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව	9	09	450	630
පුහුණු හා අධ්‍යාන අංශය	පළාත් මට්ටමේ පුහුණු අවශ්‍යතා මත සිදු කළ වැඩසටහන්	10	08	800	740
තොරතුරු තාක්ෂණ අංශය	පළාත් පාලන ආයතනවල තොරතුරු තාක්ෂණ ප්‍රවණතා පිළිබඳ පුහුණු වැඩමුළුව	9	5	200	120
	නිවසේ සිට රාජකාරී කිරීමේදී පවතින අභියෝග පිළිබඳ වැඩමුළුව	9	7	200	150
	පළාත් මට්ටමේ පුහුණු අවශ්‍යතා මත සිදු කළ වැඩසටහන්	8	1	100	50
නීති අංශය	පළාත් පාලන ආයතන වල සභා කටයුතු හා කමිටු ක්‍රමය	9	9	225	254
	පළාත් පාලන නීතිය	9	9	500	540
	පළාත් පාලන ආයතන වල ආදායම් හා බදු අය කිරීම	9	9	700	672

4.1.1 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලා සංඛ්‍යා තොරතුරු

වගුව 2


අංශය	විෂයය	අපේක්ෂිත සංඛ්‍යාව	සත්‍ය සංඛ්‍යාව
අධ්‍යන හා පුහුණු අංශය	පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - උඟව පළාත	01	01
	පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - නිලධාරීන් සඳහා	01	01
	පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - මහජන නියෝජිතයන් සඳහා	01	01
	පළාත් පාලනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව-නැගෙනහිර පළාත	02	02
	පළාත් පාලනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව-උතුරු මැද පළාත / දකුණු පළාත	02	02
	දේශපාලන විද්‍යා ප්‍රවේශය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	02	02
	කළමනාකරණ සංවර්ධන හා පුහුණු කමිටු රැස්වීම	04	04
පොදු කළමනාකරණ අංශය	මානව සම්පත් කළමනාකරණ සහතිකපත්‍ර පාඨමාලාව	01	01
තොරතුරු තාක්ෂණ අංශය	පරිගණක සහතික පත්‍ර පාඨමාලාව	01	01

4.1.2. 2021 වර්ෂය තුළ පර්යේෂණ සහ සංවර්ධන අංශය ක්‍රියාත්මක කළ පර්යේෂණ සංඛ්‍යා තොරතුරු

2021 වර්ෂය තුල රට තුල කොවිඩ් වසංගත තත්වය ව්‍යාප්තිය හේතුවෙන් පර්යේෂණ හා සංවර්ධන අංශය වෙත පර්යේෂණ කටයුතු වල නිරත වීමට අවස්තාව නොමැති විය.


4.2 ඉලක්කගත සහ තත්‍ය ප්‍රතිලාභීන්

රූපසටහන 1




4.3 අයවැයගත වෙන්කිරීම සහ සියලුම අංශ වල තත්‍ය වියදම

රූපසටහන 2




4.4. **මහා භාණ්ඩාගාර අරමුදල් මුල්‍යමය වශයෙන් උපයෝජනය සංසන්දනය - වර්ෂ 2017, වර්ෂ 2018, වර්ෂ 2019, වර්ෂ 2020 සහ වර්ෂ 2021**

රූපසටහන 3



4.5 පසුගිය වර්ෂ කිහිපයක ලාභ / අලාභ තත්ත්වයන්



රූපසටහන 4

4.6 ආයතනයෙහි එක් එක් අංශයේ කාර්යසාධනය පිළිබඳ තොරතුරු

4.6.1 අධ්‍යක්ෂ අංශය

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ සමස්ථ කටයුතු මනා ලෙස පවත්වගෙන යාමේ වගකීම අධ්‍යක්ෂ අංශය උසුලයි. අධ්‍යක්ෂවරයා මෙම අංශයේ ප්‍රධානියා ය. ආයතනය විසින් සිදු කරන ලබන සමස්ත කටයුතු අධික්ෂණය හා නියාමනය කිරීම මෙන්ම බාහිර පාර්ශව සමග මනා සම්බන්ධතාවයක් පවත්වාගැනීමත් මෙම අංශය විසින් සිදු කරනු ලබයි.

අධ්‍යක්ෂ අංශය යටතේ ඇති ඒකක,

- අභ්‍යන්තර ධාරිතා සංවර්ධන ඒකකය
- මාධ්‍ය ඒකකය

කාර්යභාරය


- ආයතනයේ සමස්ත කටයුතු අධීක්ෂණය සහ නියාමනය.
- කාර්යමණ්ඩලයේ ධාරිතා සංවර්ධනය.
- පළාත් පාලනය සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන ජාත්‍යන්තර හා දේශීය සංවිධාන සමඟ සාකච්ඡා සිදුකිරීම.
- විවිධ ව්‍යාපෘති ආයතනයට ලබාගනිමින් ගිවිසුම්ගතව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීම.
- පාලක මණ්ඩල රැස්වීම් පැවැත්වීම.
- අධ්‍යයන උපදේශන කමිටු සාමාජිකයන් පත්කොට රැස්වීම් පැවැත්වීම.
- අමාත්‍යාංශයෙන් පවරනු ලබන විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- බාහිර ආයතන සමඟ සම්බන්ධතා සන්නිවේදන කටයුතු සිදු කරමින් ආයතනයේ කටයුතු පවත්වාගෙන යාම.
- ආයතනයේ කාර්යමණ්ඩලයේ ධාරිතා සංවර්ධනයට අවශ්‍ය වැඩසටහන් සංවිධානය කිරීම,
- වාර්ෂික වාර්තා හා වාර්ෂික ක්‍රියාකාරී සැළසුම් සකස් කිරීම.
- ආයතනයේ ප්‍රකාශන කටයුතු (පුවත් හඬුන්, සඟරා) සිදු කිරීම. - මාධ්‍ය ඒකකය
- වෙබ් අඩිය හා සමාජ මාධ්‍ය යාවත්කාලීන කොට පවත්වාගෙන යාම - මාධ්‍ය ඒකකය
- ආයතනයේ පුස්තකාලය පවත්වාගෙන යාම. - මාධ්‍ය ඒකකය

කාලීන අවශ්‍යතා මත අධ්‍යක්ෂ අංයෙන් සිදු කරනු ලබන විවිධ පුහුණු වැඩසටහන් සහ පාඨමාලා සංවිධානය කිරීම.- මාධ්‍ය ඒකකය

4.6.2. ඉංජිනේරු අංශය

වෙන් කල අයවැය	-රු.1,000,000.00
පරිහරණය කල මුදල් ප්‍රමාණය	-රු.297,165.60
සම්පූර්ණ කල වැඩසටහන් / වැඩමුළු සංඛ්‍යාව	=10
තත්‍ය ප්‍රතිලාභීන්	-500

පළාත් පාලන ආයතනවල තාක්ෂණික අංශ සහ පළාත් සභාවල ඉංජිනේරු අංශවල කාර්යසාධනය වැඩි දියුණු කිරීමේ සම්පූර්ණ වගකීම පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ ඉංජිනේරු අංශය උසුලයි. ආයතනික අරමුණු වලට අනුකූලව සැලසුම් කරන ලද පුහුණු හා ප්‍රයෝගික ක්‍රියාකාරකම් හරහා මෙම අරමුණු ඉටු කර ගැනීමට අපේක්ෂිතය. ඉංජිනේරුවරුන්ට, වැඩ පරීක්ෂකවරුන්ට හා තාක්ෂණික නිලධාරින්ට තෝරාගත් අදාල ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පුහුණුව ලබා දෙනු ලබයි. එයට අතිරේකව, පළාත් සභාවලට අනුබද්ධිත තාක්ෂණික නිලධාරීන්ට හා පළාත් ඉංජිනේරුවන්ට ධාරිතා සංවර්ධන වැඩසටහන්ද සපයනු ලබයි.


4.6.3. පොදු කළමනාකරණය සහ මානව සම්පත් සංවර්ධන අංශය

වෙන් කල අයවැය	-රු.	1,000,000.00
පරිහරණය කල මුදල් ප්‍රමාණය	-රු.	376,569.03
සම්පූර්ණ කල වැඩසටහන් / වැඩමුළු සංඛ්‍යාව	-	27
තත්‍ය ප්‍රතිලාභීන්	-	566
පරිහරණය කල අරමුදල් ප්‍රතිශතය	-	**38%**

ශ්‍රී ලංකාවේ පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට ඡන්දයෙන් තේරීපත් වූ මන්ත්‍රීවරුන්ගේ හා කාර්ය මණ්ඩලයේ කළමනාකරණ කුසලතාවයන් වැඩිදියුණු කිරීම සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ පොදු කළමනාකරණ අංශය පිහිටුවනු ලැබ ඇත. මෙම අංශය යටතේ ක්‍රියාත්මක කරන ශක්තිමත් කිරීමේ වැඩසටහන්, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල කාලීන ධාරිතා ගොඩනැගීම් අවශ්‍යතා කෙරෙහි විශේෂයෙන් කේන්ද්‍රගතවී ඇත. දේශපාලන නායකයින්, රජයේ නිලධාරීන් සහ සිවිල් සමාජය අතර බලය බෙදීම හා යහපාලනය පිළිබඳ සාමාන්‍ය දැනුම්වත්බව ඉහළ නැංවීමට ප්‍රමුඛතාව දෙනු ලැබේ. ජාතික මට්ටමේ වැඩසටහන් වලට අතිරේකව අවශ්‍යතා අනුව විශේෂයෙන් සකස් කරන ලද වැඩසටහන්ද හදුන්වා දීමට නියමිතය. රටේ මෙන්ම කලාපයේ පළාත් පාලනයන්හි විශිෂ්ට පරිචයන් ගැඹුරින් සලකා බැලීමෙන් අනතුරුව සෑම වසරක් වෙනුවෙන්ම ක්‍රියාකාරී සැලැස්ම සකස් කරනු ලැබේ. විශේෂයෙන්ම පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල වර්තමාන තත්ත්වය හා පවතින ධාරිතා මට්ටම් සැලකිල්ලට ගැනීම සිදු වේ. ආකල්ප සංවර්ධනය පිළිබඳ එක්දින වැඩමුළුව සහ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව මෙම අංශය මඟින් දියත් කරනු ලබන වැඩසටහන් වේ.





කාර්යභාරය ,

- යහපාලනය ඇති කිරීම උදෙසා පළාත් සභා සහ පළාත් පාලන ආයතන වලට තේරී පත් වන සභිකයන් සහ ඒවායේ කාර්ය මණ්ඩලය සතු කළමනාකරණ කුසලතාවයන් වැඩි දියුණු කිරීම
- පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට තෝරා පත් කර ගනු ලබන සභිකයන්ට සහ ඒවායේ කාර්ය මණ්ඩලයට ස්වකීය කාර්යසාධනය වැඩිදියුණු කර ගත හැකි වන සේ ශක්‍යතා වර්ධනය සිදු කිරීම සහ ප්‍රජාව වෙත වඩා ප්‍රශස්ත රාජ්‍ය සේවයක් සැපයීමට හැකි වන පරිදි ආකල්ප වෙනස් කිරීම

- උප ජාතික මට්ටමේදී සංවර්ධනය සඳහා පවතින බාධක වෙතොත් ඒවා පිටුදැකීම සඳහා පෞද්ගලික හා රාජ්‍ය අංශ අතර හවුල්කාරිත්වය වර්ධනය කිරීම
- මහජනතාව සඳහා වඩා යහපත් සේවයක් ලබා දීම සඳහා සහ අනෙකුත් පාරිභෝගිකයන් තෘප්තිමත් කිරීම සඳහා ආයතනවල කාර්යක්ෂමතාවය, සාධනීයභාවය සහ ඵලදායිත්වය ඉහළ නැංවීම.

සෑම වසරකදීම ක්‍රියාකාරී සැලැස්ම සම්පාදනය කරනු ලබන්නේ රට තුළ මෙන්ම කලාපය තුළද පවතින පළාත් පාලනය සම්බන්ධයෙන් වන යහ පරිවයන් සියුම්ව සලකා බැලීමෙන් සහ පරීක්ෂා කිරීමෙන් අනතුරුවයි. විශේෂයෙන්ම, දැනට පවත්නා වාතාවරණය සහ පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල පවතින ශක්‍යතා මට්ටම් මෙහිදී සැලකිල්ලට ගනු ලැබේ.

4.6.4. භෞතික සැලසුම් අංශය

වෙන් කල අයවැය	-රු.	1,000,000.00
පරිහරණය කල මුදල් ප්‍රමාණය	-රු.	708,343.03
සම්පූර්ණ කල වැඩසටහන් / වැඩමුළු සංඛ්‍යාව	=	**36**
තත්‍ය ප්‍රතිලාභීන්	=	**1395**
පරිහරණය කල අරමුදල් ප්‍රතිශතය		**71%**

මෙම අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ භෞතික සැලසුම්කරණය යන ක්ෂේත්‍රය තුළ දැනුම, ආකල්ප, කුසලතා සහ සේවයෙහි ගුණාත්මක බව, පුහුණු හා උපදේශන සේවා වැඩි දියුණු කිරීම හරහා ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන සහ පළාත් සභාවල දෛශපාලන නියෝජිතයන්ගේ හා අනෙකුත් අදාළ බලධාරීන්ගේ කාර්යසාධනය වැඩි දියුණු කිරීමයි. අවසාන ඉලක්කය වන්නේ අදාළ පළාත් පාලන බල ප්‍රදේශය තුළ ජීවන තත්ත්වය හා පරිසරය වැඩි දියුණු කිරීම වේ.

පූර්ණකාලීනව සේවයේ නියුතු උපදේශකවරයෙකුගේ නායකත්වයෙන් ක්‍රියාත්ම මෙම අංශයට භෞතික සැලසුම් නිලධාරියෙකුගේ සහාය ද සැලසේ. ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම, ස්ථාන හඳුනා ගැනීම , කාර්යක්ෂම සහ සාධාරණ අයුරින් ඉඩම් භාවිතය, සහ ඉඩම් භාවිතාව හා ගොඩනැගිලි සැලසුම් සම්බන්ධයෙන් වන නීතිමය ප්‍රතිපාදන කිරීම යන කර්තවයන් පළාත් පාලන ආයතන වලට පැවරී ඇත. නාගරික සංවර්ධන අධිකාරියේ (UDA) සහ ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ (NPPD) නීති සහ අනෙකුත් අදාළ නීති ආඥාපනත් සහ නීති

ප්‍රතිසංස්කරණයට වලට අනුකූලව පළාත් පාලන ආයතන විසින් සැළසුම් පිළියෙල කිරීම අපේක්ෂිතය. එබැවින් සංවර්ධන පසුතලයක් පදනම් කරගනිමින් මෙම අංශය විසින් පළාත් පාලන ක්‍රියාකාරකම් වල ඉතා වැදගත් ක්ෂේත්‍රයක් ආවරණය කරනු ලැබේ.



කාර්යභාරය

- පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල සභිකයන්, නිලධාරීන් සහ සේවකයන් හට ස්වකීය නිල රාජකාරි වඩා කාර්යක්ෂමව සහ සාධනීය අයුරින් ඉටු කිරීමට හැකි වන පරිදි ඔවුන්ගේ කුසලතා වැඩි දියුණු කිරම අරමුණු කරගනිමින් ඔවුනට පුහුණු අවස්ථා සැලසීම.
- පළාත් සභා සහ පළාත් පාලනය සම්බන්ධයෙන් භෞතික සැලසුම් ක්ෂේත්‍රය තුළ උපදේශක කටයුතු සිදු කිරීම
- මෙම ආයතනය සහ අංශය සතු අභිමතාර්ථ වලට සමාන අභිමතාර්ථ සහිත ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි පිහිටි අනෙකුත් ආයතන සමඟ ඒකාබද්ධව කටයුතු කිරීම
- SCICG හි පර්යේෂණ අංශයේ සහාය සහිතව පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල භෞතික සැලසුම් කටයුතු ආශ්‍රිත කාරණා පිළිබඳ පර්යේෂණ පැවැත්වීම, ඒවා ප්‍රවර්ධනය කිරීම හා පර්යේෂණ වලට සහාය සැලසීම

4.6.5 මූල්‍ය කළමනාකරණ අංශය

වෙන් කල අයවැය	-රු.	1,000,000.00
පරිහරණය කල මුදල් ප්‍රමාණය	-රු.	188,700.00
සම්පූර්ණ කල වැඩසටහන් / වැඩමුළු සංඛ්‍යාව	=	**09**
තත්‍ය ප්‍රතිලාභීන්	=	**630**
පරිහරණය කල අරමුදල් ප්‍රතිශතය		**19%**

මූල්‍ය කළමනාකරණ අංශය පහත සඳහන් කරුණු ප්‍රධාන වශයෙන් ඉලක්ක කරයි. පළාත් පාලන කාර්ය මණ්ඩල වල මූල්‍ය කළමනාකරණය පිළිබඳ දැනුම සහ අවබෝධය වැඩි දියුණු කිරීම, ඡන්දයෙන් තේරීපත් වූ මන්ත්‍රීවරුන් වෙනුවෙන් මූල්‍ය කළමනාකරණය පිළිබඳ වැඩමුළු මෙහෙයවීම, පළාත් පාලන ආයතනවලට මූල්‍ය කළමනාකරණයෙහි සිය කාර්යක්ෂම බව වැඩිදියුණු කර ගැනීම පිණිස උපදේශන ලබා දීම, මූලය කළමනාකරණය පිළිබඳව පුහුණුකරුවන් පුහුණු කිරීම සම්බන්ධයෙන් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් සකස් කරන ලද වැඩසටහන් පළාත් පාලන ආයතනවල කාර්යසාධනය වැඩි දියුණු කිරීමෙහිලා අතිශයින් සඵලදායක වී ඇත. එසේ වුවද, මූලය කළමනාකරණය පිළිබඳ දැනුම වෙනුවෙන් තවමත් ඉල්ලුම පවතී. අවශ්‍යතාව මත පදනම්ව පහත සඳහන් ක්ෂේත්‍ර වෙනුවෙන්ද පුහුණු වැඩසටහන් මෙහෙයවනු ලැබ ඇත.

කාර්යභාරය

- මූල්‍ය ප්‍රකාශන පිලියෙළ කර ඉදිරිපත් කිරීම
- අයවැය පාලන සහ අධීක්ෂණය පිළියෙල කිරීම
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ ඒවා අදාළ කර ගැනීම පිළිබඳව දැනුවත් කිරීම මුදල් ප්‍රවාහ ප්‍රකාශන හා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශන පිළියෙල කිරීම
- විගණනය හා ශ්‍රී ලංකාවේ විගණන ප්‍රමිති පිළිබඳව දැනුවත් කිරීම
- අභ්‍යන්තර පාලන පද්ධති පිළිබඳව දැනුවත් කිරීම
- පළාත් පාලන මූල්‍ය කළමනාකරණය පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාවක් මෙහෙයවීම
- මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳව සේවාස්ථ පුහුණුව සැපයීම

4.6.6 නීති හා නීති සම්පාදන අංශය

වෙන් කල අයවැය	-රු.	1,000,000.00
පරිහරණය කල මුදල් ප්‍රමාණය	-රු.	150,175.00
සම්පූර්ණ කල වැඩසටහන් / වැඩමුළු සංඛ්‍යාව	-	**18**
තත්‍ය ප්‍රතිලාභීන්	-	**926**
පරිහරණය කල අරමුදල් ප්‍රතිශතය	-	**15%**

ශ්‍රී ලංකාවේ උප ජාතික පාලන ආයතනවල ඡන්දයෙන් තේරී පත් වූ මන්ත්‍රීවරුන්ගේ හා නිලධාරීන්ගේ ව්‍යවස්ථාදායක ධාරිතා ශක්තිමත් කිරීම පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ නීති හා ව්‍යවස්ථාදායක කටයුතු අංශයට පැවරී ඇත. රටේ උප ජාතික පාලනය

සාදන පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල නෛතික බල පැවරුම් අදාල පාලන නීතිවලින් ව්‍යුත්පන්න වේ. එබැවින්, ඒවාගේ ව්‍යවස්ථාව, ස්ථාපනය, බලතල හා කාර්යයන් නෛතික පදනමක් මත ගොඩනැගී තිබේ.

පළාත් සභා හා පළාත් පාලන ආයතනවල ඡන්දයෙන් තේරී පත් වූ මන්ත්‍රීවරුන් හා නිලධාරීන් සතුව ව්‍යවස්ථාදායක ධාරිතාව, එනම් අනු නීති හා අනුව්‍යවස්ථා කෙටුම්පත් කිරීම, සමාලෝචනය කිරීම, වලංගු කිරීමේ හා සම්මත කිරීමේ මෙන්ම පවත්නා නීතිය එදිනෙදා ක්‍රියාකාරකම් වලට ආදේශ කිරීමේ ධාරිතාව නොමැති බව නිරීක්ෂණය වී ඇත. පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට පුළුල් පරාසයක වන නෛතික ගැටළු, අක්‍රමිකතා, වැරදි භාවිතයන් හා නීති උල්ලංඝනය කිරීම් වලට මුහුණ දීමට මඟපෑදූ ප්‍රධාන අඩුපාඩුවක් ලෙස මෙය හඳුනාගනු ලැබ ඇත.

පළාත් සභා හා පළාත් පාලන ආයතනවල වර්තමාන තත්ත්වය, පුහුණු අවශ්‍යතා හා උවමනාවන් හඳුනාගෙන තක්සේරු කිරීමෙන් පසුව හා ඒවා සඵලදායක ලෙස ආමන්ත්‍රණය කිරීම සඳහා නීති හා ව්‍යවස්ථාදායක කටයුතු අංශයෙහි වැඩසටහන් විශේෂයෙන් සැලසුම් කරනු ලැබ තිබේ.

තවද, රටේ සාමාන්‍ය නීතිය පිළිබඳව පළාත් පාලන ආයතනවල දැනට පවතින දැනුම් පරතරය පියවීම සඳහා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, අනු නීති, පරිපාලන නීතිය, අධිකරණ ක්‍රියාපටිපාටිය හා පළාත් පාලන ආයතනවල සභා කටයුතු කෙරෙහි වඩාත් ගැඹුරු අවධාරණයක් සහිතව ‘‘පළාත් පාලන නීතිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව’’ නම් නව පාඨමාලාවක් හඳුන්වා දී තිබේ.



4.6.7. පුහුණු අංශය

වෙන් කල අයවැය	-රු.	1,000,000.00
පරිහරණය කල මුදල් ප්‍රමාණය	-රු.	702,057.50
සම්පූර්ණ කල වැඩසටහන් / වැඩමුළු සංඛ්‍යාව	-	08
තත්‍ය ප්‍රතිලාභීන්	-	**740**
පරිහරණය කල අරමුදල් ප්‍රතිශතය	-	**70%**

ආයතනයෙහි සංස්ථාපිත පනත මගින් පනවන ලද සිවු කාර්යයන් අතුරෙන් ප්‍රධාන කාර්යයක් වන පුහුණුව සම්බන්ධ කටයුතු පුහුණු අංශය මගින් සිදු කරේ. නියෝජය අධ්‍යක්ෂකවරයකු නායකත්වයෙන් ක්‍රියාත්මක වන අධ්‍යයන අංශය පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ජන්දයෙන් තේරී පත් වූ මන්ත්‍රීවරුන් හා නිලධාරීන් වෙනුවෙන් මානව සම්පත් සංවර්ධනය හා සබැඳි පහත සඳහන් ක්‍රියාකාරකම් ඉටු කරනු ලබයි.

කාර්යභාරය ,

- පුහුණු අවශ්‍යතා තක්සේරු කිරීම
- ඉලක්ක කණ්ඩායම් හඳුනාගැනීම
- පුහුණු අත්පොත් හා මොඩියුල සකස් කිරීම.
- පුහුණු කරන්නන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල මන්ත්‍රීවරුන් හා කාර්යමණ්ඩලය වෙනුවෙන් ප්‍රධාන ක්ෂේත්‍රවල පුහුණු වැඩසටහන් වෙනුවෙන් කටයුතු සැලැස්වීම.
- පළාත් පාලනය පිළිබඳව ජාතික මට්ටමේ ඩිප්ලෝමා සහතිකපත්‍ර පාඨමාලා මෙහෙයවීම.
    - ප්‍රජා සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව
    - පළාත් පාලන උසස් ඩිප්ලෝමා පාඨමාලාව
    - මහජන නියෝජිතයන් සඳහා පළාත් පාලනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
- පළාත් සභා සහ පළාත් පාලන පුහුණු කිරීම් මෙහෙයවීම සඳහා කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකක හා පළාත් සභා හා පළාත් පාලන ආයතනවලට සහාය වී ශක්තිමත් කිරීම.
- ප්‍රාදේශීය මට්ටම් වලදී කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකක සහ පළාත් සභා හා පළාත් පාලන ආයතන විසින් මෙහයවනු ලබන පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය, අධීක්ෂණය හා ඇගයීම.

- විදේශ අරමුදල් සම්පාදිත ආයතන සමග ක්‍රියාත්මක කරනු ලබන බාහිර පැවරුම් සම්බන්ධීකරණය හා එහි කාර්යයන් ක්‍රියාත්මක කිරීම

4.6.8. පර්යේෂණ සහ සංවර්ධන අංශය

වෙන් කල අයවැය	-	රු.	1,000,000.00
පරිහරණය කල මුදල් ප්‍රමාණය	-	රු.	1,739,822.49
සම්පූර්ණ කල වැඩසටහන් / වැඩමුළු සංඛ්‍යාව	-	**07**	
තත්‍ය ප්‍රතිලාභීන්	-	**149**	
පරිහරණය කල අරමුදල් ප්‍රතිශතය	-	**174%**	

පළාත් පාලන ආයතන සහ පළාත් සභා යන ක්ෂේත්‍ර දෙකම සවිමත් කිරීම අරමුණු කර ගනිමින් පර්යේෂණ සහ සමීක්ෂණ සිදු කිරීම මගින් සහ ඒවායින් අනාවරණය කරගන්නා කරුණු සහ නිර්දේශ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය සඳහා බෙදා හැරීම මගින් පළාත් පාලනය සඳහා වන ශ්‍රී ලංකා ආයතනයේ පර්යේෂණ සහ සංවර්ධන අංශය, පළාත් පාලන ආයතනවලට සහ පළාත් සභා වලට සහාය සලසනු ලැබේ. එසේම, මෙම අංශය මගින් සිදු කරනු ලබන පර්යේෂණ අධ්‍යන තුළින් අනාවරණය කර ගන්නා කාරණා මත පදනම්ව ශක්‍යතා වර්ධන වැඩසටහන් සිදුකිරීමද එහි කාර්යභාරයකි.



කාර්යභාරය

- පළාත් පාලන ආයතන සහ පළාත් සභා අංශ වල ශක්‍යතා වර්ධනය උදෙසා එම අංශ පිළිබඳ පර්යේෂණ කටයුතු සිදුකිරීමට වගකීම දැරීම, එම කටයුතු සිදු කිරීම හා කිරීම පළාත් පාලන ආයතනවල හා පළාත් සභාවල ධාරිතා වැඩි දියුණු කොට වර්ධනය කිරීම සඳහා පර්යේෂණ අධ්‍යයනයන් සිදු කිරීම හා ප්‍රවර්ධනය කිරීම.
- පර්යේෂණ මගින් හෙළිදරව් කරගත් කරුණු අදාල ප්‍රතිපත්ති සම්පාදකයන් සහ ක්‍රියාත්මක කිරීම, නියෝජිත ආයතන අතර බෙදාහැරීම.

- පාලනය යන ක්ෂේත්‍රයන්හී ජාතික මෙන්ම ජාත්‍යන්තර පර්යේෂණ ආයතන සමඟ සම්බන්ධ වීම.
- නව පර්යේෂණ මූලපිරීම් වෙනුවෙන් වැදගත් ක්ෂේත්‍ර හෙළිදරව් කර ගැනීම.
- පළාත් සභා හා පළාත් පාලන ආයතනවල දත්ත සමුදායක් නඩත්තු කිරීම.
- පර්යේෂණ නිමැවුම් ලේඛනගත කිරීම පළාත් පාලනය හා පළාත් සභාවට සම්බන්ධ අදාල ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීම.
- ජාතික, පළාත් හා දිස්ත්‍රික් මට්ටම් වලදී පළාත් පාලනය හා පළාත් සභා අංශය හා සම්බන්ධ අදාළ නිලධාරින් වෙනුවෙන් පර්යේෂණ ක්‍රමවේද පාඨමාලා පැවැත්වීම.
- පර්යේෂණවල හෙළිදරව් කරගැනීම් මත පදනම්ව සංවර්ධන ගැටළු සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන හා පළාත් සභාවල ඡන්දයෙන් තේරී පත් වූ මන්ත්‍රීවරුන් හා නිලධාරීන් වෙනුවෙන් අවශ්‍ය පුහුණුව ලබා දීම.

4.6.9. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය අංශය

වෙන් කල අයවැය	-රු.	1,000,000.00
පරිහරණය කල මුදල් ප්‍රමාණය	-රු.	338,235.00
සම්පූර්ණ කල වැඩසටහන් / වැඩමුළු සංඛ්‍යාව	-	**13**
තත්‍ය ප්‍රතිලාභීන්	-	**320**
පරිහරණය කල අරමුදල් ප්‍රතිශතය	-	**34%**

ආයතනයේ අභ්‍යන්තර විද්‍යුත් තැපැල් සේවා, පරිගණක ජාලය, දත්ත ගබඩාවන්, පරිගණක දෘඩාංග හා මෘදුකාංග ආදී තොරතුරු තාක්ෂණික මූලාශ්‍ර සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සහ පවත්වාගෙන යාම තොරතුරු තාක්ෂණ ඒකකයේ වගකීම වේ. ඊට අමතරව පළාත් පාලන ආයතනවල තොරතුරු තාක්ෂණ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමද මෙම අංශයට පැවරෙන කාර්යභාරයකි.

කාර්යභාරය

- ආයතනයේ සහ පළාත් පාලන අංශයේ කාර්ය මණ්ඩලය සඳහා ඊමේල් සහ අන්තර්ජාල සේවා සැපයීම.
- වෙබ් අඩවිය නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාම
- ආයතනයේ පරිගණක සහ ප්‍රාදේශීය ජාල පවත්වා ගැනීම
- තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් පළාත් පාලන ආයතන කාර්යමණ්ඩලය පුහුණු කිරීම
- ඊමේල් සහ අන්තර්ජාල මගින් නිල තොරතුරු බෙදා හැරීම

- අමාත්‍යාංශය සහ නියෝජිතායතන වෙත තොරතුරු තාක්ෂණය පාදක කොටගත් සේවා සැපයීම
- පළාත් පාලන ආයතනවල තොරතුරු තාක්ෂණ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම

4.7. SLILG මගින් සිදු කරනු ලබන පැවරුම් / ව්‍යාපෘති හා උපදේශන සේවා– 2021 වර්ෂය

4.7.1. UNDP – CDLG ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක ධාරිතා සංවර්ධන වැඩසටහන

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන හා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය අතර 2020 වර්ෂයේ සැප්තැම්බර් 08 දින ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතියේ (LDSP) යටතේ උතුර, උතුරු මැද, නැගෙනහිර හා ඌව පළාත් පාලන ආයතනයන්හි ධාරිතා සංවර්ධනය සඳහා ගිවිසුම්ගත වීම සිදු කරන ලදී. මූලික වශයෙන් වැඩසටහන් 160 පැවැත්වීම සඳහා මෙම ගිවිසුම් ගතවීම සිදුකරන ලද අතර , 2020 වසර අවසානයේදී ආරම්භ කරන ලද මෙම වැඩසටහනට අනුව ප්‍රස්තූත වර්ෂය තුල වැඩසටහන් 05 ක් සම්පූර්ණ කරන ලදී.

05. විගණන මතය 2021

■

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සිඔබ්/ඩී/එස්එල්අයිඑල්පී /එෆ්ජ්/2021
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2022 ජූනි 28 දින

සභාපති,
පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය.

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක සභාවේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති විධිවිධානවලට යොමුව	නිරීක්ෂණ
ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XXX පරිච්ඡේදයේ I වගන්තිය	රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතලවලට පටහැනිව විවිධ තනතුරුවල නියුතු නිලධාරීන් 08 දෙනෙකුට මොඩියුලයන් සකස් කිරීමට පැවරුම් භාර දී ඇති අතර, ඒ වෙනුවෙන් රු.460,000ක් ගෙවා තිබුණි.

ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශ්වයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) පෙර වර්ෂ වෙනුවෙන් වැය කිරීමට නියමිත පාඨමාලා වියදම් රු.1,982,765ක් සමාලෝචිත වර්ෂයේ ආදායමට එරෙහිව ලියා හැර තිබීම සහ පෙර වර්ෂ වෙනුවෙන් ලැබීමට නියමිත රු.3,319,875ක පාඨමාලා ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශන වලට ගලපා තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.1,337,110කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් යෙදවූ මුදල් ප්‍රවාහයට අයිතම 03කට අදාල එකතුව රු.865,700ක් සහ මූල්‍ය ක්‍රියාකාරකම් වල පොලී අදායමට රු.270,027ක් නිවැරදිව ගලපා නොතිබුණි.

1.3 ආයතනයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතු ය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවා ද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතු ය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

නීතිරීති, රෙගුලාසි හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධිවිධානවලට යොමුව	නිරීක්ෂණ
(අ) 1999 අංක 31 දරන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පනතේ II කොටස 3 ඡේදය	පාලක සභාව විසින් පවරන ලද බලතල හා කර්තව්‍යයන් අධ්‍යක්ෂවරයා විසින් ක්‍රියාත්මක කිරීමද, ඉටු කිරීමද කළ යුතු නමුත් පාලක සභාවේ අනුමැතියකින් තොරව2020 සැප්තැම්බර් 07 දින අධ්‍යක්ෂවරයා විසින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන සමඟ අවබෝධතා ගිවිසුමට අත්සන් කර ක්‍රියාත්මක කර තිබුණි.
(ආ) එම	2021 අගෝස්තු 31 දින වන විට ව්‍යාපෘතියේ කටයුතු සඳහා රු.12,138,421ක් පාලක සභාවේ අනුමැතියකින් තොරව වියදම් කර තිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව,

2.3 වෙනත් කරුණු

අංක 01/2014 හා 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතා අනුව සකස් කර සැලැස්ම, ක්‍රියාත්මක කළ යුතු කාල රාමුව හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමැවුම්/ ප්‍රතිඵල ඇතුළත් වන පරිදි සකස් කළ යුතු වුවත් ආයතනය විසින් පිළියෙල කර ඇති ක්‍රියාකාරී සැලැස්ම එසේ පිළියෙල කර නොතිබුණි.

ඩබ්. පී. සී වික්‍රමරත්න
විගණකාධිපති

6.0 මූල්‍ය තොරතුරු

පටුන

2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය	57
2021.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	58
2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය	60
2021.12.31 දිනට ශුද්ධ වත්කම් වල වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය	61
ගිණුම් පිළිබඳ සටහන්	63
ගිණුම්කරණ ප්‍රතිපත්ති	51
ඇමුණුම්	74

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. වාර්තා කිරීමේ ආස්ථිත්‍යය

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය 1999 අංක 31 දරන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පනත යටතේ ස්ථාපිත කර ඇති ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලින් ජනතාවට කාර්යක්ෂම සහ ඵලදායී සේවාවක් ඉටු කිරීම පිණිස එම ආයතනවල ආයතනික සහ කළමනාකරණ ධාරිතාවන් ඉහළ නැංවීම මෙම ආයතනයේ පරමාර්ථය වේ. ඒ අනුව ධාරිතා වැඩිදියුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ නවීන සහ ඵලදායී පළාත් පාලන ක්‍රමයක් ස්ථාපිත කිරීමට මඟපාදන පර්යේෂණ, පුහුණුව, උපදේශනය සහ තොරතුරු බෙදාහැරීම හරහා යහ පාලනය ප්‍රවර්ධනය කිරීම මඟින් බලය බෙදීමේ ක්‍රියාවලියට සහායවීම සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයට බලය පවරා ඇත.

2.0 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශනය, සමකොටස්වල වෙනස්කම පිළිබඳ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ඇතුළත් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම සහ ඓතිහාසික පිරිවැය පිරිවැය පදනම මත, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර ඇත.

3.0 ආදායම හඳුනා ගැනීම

3.1 ආණ්ඩුවේ දායකත්වය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 අනුව පුනරාවර්තන සහ ප්‍රාග්ධන ලෙස වාර්ෂිකව ආණ්ඩුවෙන් ලැබෙන ප්‍රදාන ආයතනයේ ආදායම ලෙස හඳුනා ගනී.

3.2 ඩිප්ලෝමා පාඨමාලා සහ සහතික පාඨමාලා ආදායම

ආයතනය 2021 වර්ෂයේ දී ආරම්භ කළ එක් ඩිප්ලෝමා පාඨමාලාවේ සහ 2021 වර්ෂයේ දී ආරම්භ කළ සහතිකපත්‍ර පාඨමාලා දෙකේ ආදායම හඳුනා ගෙන වාර්තා කර ඇත. එයට අමතරව 2021 වර්ෂයට පෙර ආරම්භ කළ පාඨමාලාවල ආදායම ද උපචිත පදනම යටතේ ගලපා ඇත.

3.3 විශේෂ ව්‍යාපෘති ආදායම

ආයතනය 2021 වර්ෂය සඳහා UNDP CDLG ව්‍යාපෘතියෙන් රු. 21,518,014.12ක ආදායමක් වාර්තා කරයි. (SLILG කාර්ය මණ්ඩල දායකත්ව වටිනාකම ඇතුළුව)

3.4 වෙනත් ආදායම

රු. 1,998,144.71ක අනෙකුත් ආදායමට කාල තැම්පතුවල පොලී ආදායම, ඉතුරුම් ගිණුම්වල පොලී ආදායම, කාර්ය මණ්ඩල ණය පොලිය, ප්‍රකාශනවල ආදායම සහ අන්තර්ජාතික පර්යේෂණ සම්මන්ත්‍රණවල ලියාපදිංචි ආදායම ඇතුළත් වේ.

4. වියදම් හඳුනා ගැනීම

4.1 පරිපාලන සහ ආයතනික වියදම්

සේවකයින් සඳහා පෞද්ගලික පාරිශ්‍රමිකය, කාර්යාල සැපයුම්, නඩත්තු වියදම් සහ කොන්ත්‍රාත් සේවා සඳහා වියදම් පරිපාලන සහ ආයතනික වියදම්වලට ඇතුළත් වේ. මෙම වියදම්වලින් වැඩි ප්‍රමාණයක් භාණ්ඩාගාරයෙන් ලැබෙන වාර්ෂික පුනරාවර්තන ප්‍රදානවලින් ආවරණය වන අතර කිසියම් වෙනස්කම් ආයතනයේ පාඨමාලා ආදායම් ඉතුරුම්වලින් ආවරණය වනු ඇත.

4.2 මානව සම්පත් සංවර්ධන වියදම්

ආණ්ඩුවේ ප්‍රාග්ධන ප්‍රදාන අංග දෙකකි. මානව සම්පත් සංවර්ධන වියදම් (පළාත් පාලන ආයතන සහ පළාත් සභාවල නිලධාරීන් සහ තෝරා පත් කළ සාමාජිකයින්) සහ ජංගම නොවන වත්කම් අත්කර ගැනීමේ, ව්‍යාප්ත කිරීමේ හෝ වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා දැරූ වියදම් ඇතුළත් වේ. පළාත් සභා සහ පළාත් පාලන අංශ සඳහා ආයතනය මඟින් පුහුණුව සහ පර්යේෂණ පැවැත්වීම සඳහා දැරූ වියදම් මානව සම්පත් සංවර්ධන වියදම්වලට ඇතුළත් වේ. මෙම වියදම් ආණ්ඩුවේ ප්‍රාග්ධන ප්‍රදාන අංගයෙන් ආවරණය වන අතර වෙනස්කමක් තිබෙන්නේ නම් එය ආයතනයේ ඉතුරුම්වලින් ආවරණය කරනු ලැබේ.

4.3 ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලා වියදම්

2021 වර්ෂයේ දී ආරම්භ කළ ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලාවල වියදම් උපචිත පදනම මත වාර්තා කරනු ලැබේ. තව ද උපචිත පදනම යටතේ වාර්තා කළ පෙර වර්ෂවල සිට පැවත එන පාඨමාලා වියදම් කිහිපයක් ද වේ.

4.4 විශේෂ ව්‍යාපෘති වියදම්

2021 වර්ෂය සඳහා UNDP CDLG ව්‍යාපෘතියෙන් රු. 14,928,882.01 ක වියදම් විශේෂ ව්‍යාපෘති වියදම්වලට ඇතුළත් වේ.

4.5 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සහ ක්ෂයවීම්

1983 අංක 12 දරන පාරිතෝෂික පනත යටතේ රැකියා අවසාන ප්‍රතිලාභ වෙනුවෙන් රු. 9,559,066.50 ක ප්‍රතිපාදන වෙන්කර ඇති අතර මෙය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම නොවන වගකීම් යටතේ වර්ගීකරණය කර ඇත.

5 දේපළ, පිරියත සහ උපකරණ

5.1 තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් 2015 වර්ෂයේ දී ගිණුම්කරණ කාර්යය සඳහා ඉඩම් සහ ගොඩනැගිලි තක්සේරුව සිදු කරන ලදී. 2004 වර්ෂයේ දී රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් අයිතිය මාරු කිරීම සිදු කරන ලදී.

5.2 (ගොඩනැගිලි සහ පුස්තකාල පොත් හැරුණු කොට) වාහන, යන්ත්‍රෝපකරණ සහ කාර්යාල උපකරණ, පරිගණක හා පරිගණක උපාංග සහ ගෘහභාණ්ඩ සහ තිරවුරු යන වත්කම් කාණ්ඩ 2019.09.01 වැනි දින ප්‍රත්‍යාගණනය සිදු කළ අතර භෞතික තක්සේරු ශේෂයේ වෙනස්කම් ආණ්ඩුවේ දායකත්ව ප්‍රාග්ධනයට ගලපා ඇති අතර ප්‍රත්‍යාගණනයේ ආදායම ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කර ඇත.

5.3 ක්ෂය කිරීමේ කාර්යය සඳහා වත්කම්වල ඵලදායී ජීවිත කාලය පහත දක්වා ඇති පරිදි වේ.

වත්කම් වර්ගීකරණය	ජීවිත කාලය වර්ෂ	ක්ෂයවීම් අනුපාතය
යන්ත්‍ර හා කාර්යාල උපකරණ	10	10%
පරිගණක හා මෙවලම්	5	20%
වාහන	5	20%
පුස්තකාල පොත්	10	10%
ගොඩනැගිලි	20	5%
ගෘහභාණ්ඩ හා තිරවුරු	10	10%

5.3 ක්ෂයවීම්

2021 වර්ෂයේ දී වත්කම් භාවිතා කිරීමේ දිනයේ සිට ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය මත සරල මාර්ග ක්‍රමය යටතේ ගණනය කර ක්ෂය හඳුනා ගෙන ඇත.

6.0 කාරක ප්‍රාග්ධනය

නව ගොඩනැගිලි ඉදිකිරීම කාරක ප්‍රාග්ධනය ලෙස සලකනු ලබන අතර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ වර්ගීකරණය කර ඇත. කෙසේවුව ද, 2014 වන තෙක් ඉදිකිරීම් සිදු කර නොමැත. 2021 වර්ෂයේ දී ස්වාධීන උපදේශකවරයෙක් මාර්ගයෙන් ඝන විමර්ශනය සහ ගොඩගැසීම් පරීක්ෂණ වාර්තාවක් කැඳවීමට කළමනාකාරීත්වය විසින් තීරණය කරන ලදී. මධ්‍යම

ඉංජිනේරු උපදේශක කාර්යාංශය රු. 918,000.00 ක පිරිවැයක් යටතේ උපදේශන කටයුතු සිදු කර ඇත. මෙම පිරිවැය ගොඩනැගිලි ඉදිකිරීම් පිරිවැයට එකතු කර ඇත.

7.0 බඩු තොග

ලිපි ලේඛන තොග ශේෂය සහ ප්‍රකාශන ශේෂය බඩු තොගවලට ඇතුළත් වේ. පෙර පිවිසි පෙර නිකුතු ක්‍රමය පදනම මත ලිපි ද්‍රව්‍ය පිරිවැය තක්සේරුව සිදු කර ඇත.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සමඟ එක්ව 2021.11.29 වැනි දින ප්‍රකාශන තොග තක්සේරු කිරීම නිමා කරන ලදී. ප්‍රකාශන තොග ශුද්ධ හඳුනා ගැනීමේ වටිනාකම (2014ට පෙර මුද්‍රණය කළ හෝ මිල දී ගත්) රු. 1,656,098.00ක් වන අතර (2014ට පසු මුද්‍රණය කළ) ප්‍රකාශන තොග ශුද්ධ හඳුනා ගැනීමේ වටිනාකම රු. 331,073..00කි. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ වර්තමාන ප්‍රකාශන වටිනාකම ප්‍රකාශනයේ පිරිවැය ලෙස සලකනු ලැබේ. ශ්‍රී.ල.රා.ගි.ප්‍රමිති අංක 09 අනුව රු. 1,517,201.00ක් වන ප්‍රකාශන තොග පිරිවැය වටිනාකම තොග වටිනාකම ලෙස වාර්තා කර ඇත.

8.0 පූර්ව ගෙවීම් සහ ලැබිය යුතු දෑ

8.1 පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබුණු රු. 492,000.00ක මුදල අංක 170/07 දරන පාලක සභා තීරණය මත පදනම්ව බොල් ණය ලෙස කපා හරින ලදී.

8.2 උසස් අධ්‍යාපන අනුග්‍රාහක ලැබීම්

ප්‍රමාණවත් අවශ්‍යතාවන් සම්පූර්ණ කරන SLILG කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ උසස් අධ්‍යාපන පහසුකම් සඳහා මූල්‍ය අනුග්‍රහය ලබාදීම සඳහා ආයතනයේ පාලක සභාව මඟින් අනුමත කර ඇත. (පාලක සභා තීරණ අංක 167/13)

2021 වර්ෂයේ දී ආයතනය මඟින් ඒ. ඩී. වීරසේකර මහත්මියට (වැඩසටහන් නිලධාරී - පාලන අංශය) පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් රු. 125,000.00 ක් ප්‍රදානය කරන ලදී. කොන්ත්‍රාත්තුව අවසාන වන තෙක් මෙම මුදල සේවකයාගෙන් ලැබිය යුතු අගයක් ලෙස ගලපා ඇත.

8.3 පාඨමාලා ආදායම් ලැබීම්

ඩිප්ලෝමා වැඩසටහන් තුනක සහ එක් සහතිකපත්‍ර පාඨමාලාවක ආදායම උපචිත පදනම මත වාර්තා කර ඇත.

8.4 විවිධ ණයගැතියෝ

හිටපු අධ්‍යක්ෂක ජේ. ජේ. ලියනගේ මහතාගේ වැටුප් පියවර වෙනස වන රු. 498,33.33ක මුදල අංක 171/03 දරන පාලක සභා තීරණය මත පදනම්ව ණයකරුවෙක් ගලපන ලදී.

9.0 මුදල් සහ මුදල් සමාන දේ

ජංගම ගිණුම් දෙකේ ශේෂයන් සහ ඉතුරුම් ගිණුම් එකක ශේෂය මුදල් සහ මුල් සමාන දෑ යන්නට ඇතුළත් වේ.

10.0 ආණ්ඩුවේ ප්‍රාග්ධන දායකත්වය

රු. මිලියන 506.05ක ආණ්ඩුවේ ප්‍රාග්ධන දායකත්ව වටිනාකමට රු. මිලියන 33.5 ක වාහන වටිනාකම, නව ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ප්‍රදානය වන රු. මිලියන 44ක වටිනාකම, ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය සඳහා වූ රු. මිලියන 422.55ක වටිනාකම ඇතුළත් වේ. 2021 වර්ෂයේ දී වාහන වටිනාකම සම්පූර්ණයෙන්ම ක්‍රමක්ෂය කර, සමුච්චිත අරමුදලට ගලපා ඇත.

11.0 UNDP ප්‍රදාන

රු. 714,658.79 ක වටිනාකම සම්පූර්ණයෙන්ම ක්‍රමක්ෂය කර සමුච්චිත අරමුදලට ගලපා ඇත.

එයට අමතරව ආයතනයට රු. 210,904.00ක වටිනාකම ඇති සම්මන්ත්‍රණ කැමරාවක් ලැබුණි. මෙම පරිත්‍යාගයේ වටිනාකම **UNDP** ප්‍රදාන ගිණුමට ගලපන ලද අතර 2021.11.10 දින සිට වාර්ෂිකව 10%ක අනුපාතයෙන් ක්‍රමක්ෂය කිරීම ආරම්භ කරන ලදී.

12.0 ව්‍යාපෘති දායක ප්‍රාග්ධනය සහ ආසියානු පදනමෙන් ලැබූ ප්‍රදාන

රු. 1,826,177.50ක වටිනාකම සම්පූර්ණයෙන්ම ක්‍රමක්ෂය කර, සමුච්චිත අරමුලට ගලපා ඇත.

13.0 NELSI ව්‍යාපෘතියෙන් ලැබුනු ප්‍රදාන (NELSIP)

2017 වර්ෂයේ දී අමාත්‍යාංශය හරහා ලැබුනු **NELSI** ව්‍යාපෘතියේ මුළු ප්‍රදානය රු. 1,826,177.50ක් විය. මුළු ප්‍රදාන වටිනාකම ශුද්ධ වත්කම්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇති අතර වර්ෂ පහක කාලයකට 20%ක වාර්ෂික ක්ෂයවීම් වටිනාකමක් ප්‍රාග්ධනීය කරනු ඇත.

14.0 පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබුනු ප්‍රදාන

ආයතනයට 2019.06.01 වැනි දින පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් රු. 273,000.00ක් වටිනා ඡායාපිටපත් යන්ත්‍රයක් පරිත්‍යාගයක් ලෙස ලැබුණි. මෙම වටිනාකම 2019 සිට 10%ක වාර්ෂික අනුපාතයට ක්‍රමක්ෂය කර ඇත. පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් මාරු කළ අයිතම අතර ඇතැම් භාණ්ඩ මිලකරණයේ දී වැදගත් නොවන බවට පෙනී ගියේය. අමාත්‍යාංශයෙන් ලැබුණු අයිතමවලින් රු. 5,000.00කට වැඩි වටිනාකමක් ඇති භාණ්ඩ පමණක් වාර්තා කිරීමට තීරණය කරන ලදී.

15.0 ණයකරුවෝ

15.1 පාඨමාලා අටක හිමිවිය යුතු වියදම් වටිනාකම් ණයකරුවෝ යටතේ වෙන්කිරීම් ලෙස ගලපා ඇත.

15.2 ආයතනයේ වෙබ් අඩවිය ගොඩනැගීම සඳහා රඳවාගත් මුදල ජංගම වගකීමක් ලෙස ගලපා ඇත.

16.0 කාර්ය මණ්ඩල ණය සඳහා පිළිවැටුම් අරමුදල

ඉතුරුම් ගිණුම අංක 2329975 කාර්ය මණ්ඩල ණය සඳහා ක්‍රියාත්මක වේ. කාර්ය මණ්ඩල ණය පොලිය සහ ඉතුරුම් ගිණුම වෙනත් ආදායම යටතේ දක්වා ඇත. කෙසේවුව ද, එකී පොලී මුදල් සෘජුව ඉතුරුම් ගිණුමට ප්‍රේෂණය වන අතර සේවකයින් සඳහා ආපදා ණය ප්‍රදානය කිරීමට පමණක් භාවිතා කරනු ලැබේ.

17.0 වාර්තා කරන දිනයෙන් පසුව සිදු වන සිදුවීම්

වාර්තා කරන කාලපරිච්ඡේදය අවසානයේ සිට මූල්‍ය වාර්තා නිකුත් කරනු ලැබීමට අවසරය ලැබෙන දිනය අතරතුර සිදුවන දේ වාර්තා කරන කාලයෙන් පසු සිදු වන සිදුවීම් වේ. වාර්තා කරන කාලයෙන් පසුව සිදු වන සිදුවීම්වල වැදගත්කම සලකා බලනු ලබන අතර ශ්‍රී.ල.රා.ගි.ප්‍ර. අංක 06 අනුව මූල්‍ය ප්‍රකාශනවල සුදුසු ගැලපීම් සිදු කිරීම හෝ හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන්	***2021/12/31***	***2020/12/31***
මෙහෙයුම් ආදායම			
ආණ්ඩුවේ දායකත්වය	*01*	*39,780,000.00*	*40,620,000.00*
ඩිප්ලෝමා පාඨමාලා ආදායම	*02*	*5,444,900.00*	*527,575.00*
සහතිකපත්‍ර පාඨමාලා ආදායම	*03*	*5,374,925.00*	*2,040,800.00*
විශේෂ ව්‍යාපෘති ආදායම	*04*	*21,709,989.12*	*2,322,478.94*
වෙනත් ආදායම	*05*	*1,998,144.71*	*2,437,633.10*
මුළු මෙහෙයුම් ආදායම		***74,307,958.83***	***47,948,487.04***
මෙහෙයුම් වියදම්			
පරිපාලන හා ආයතන වියදම්	*06*	*35,086,085.20*	*33,931,876.66*
මානව සම්පත් සංවර්ධන වියදම්	*07*	*5,476,765.88*	*4,750,034.37*
ඩිප්ලෝමා පාඨමාලා වියදම්	*08*	*3,821,567.13*	*835,941.99*
සහතිකපත්‍ර පාඨමාලා වියදම්	*09*	*1,038,297.34*	*521,211.20*
විශේෂ ව්‍යාපෘති වියදම්	*10*	*14,928,882.01*	*1,605,559.67*
වෙනත් වියදම්	*11*	*11,460.00*	*8,992,443.04*
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සහ ක්ෂයවීම්	*12*	*8,773,708.25*	*-*
මුළු මෙහෙයුම් වියදම්		***69,136,765.81***	***50,637,066.93***
ආදායම් බදුවලට පෙර වර්ෂය සඳහා අතිරික්තය/ (හිඟය)		***5,171,193.02***	***(2,688,579.89)***
සාංගමික ආදායම් බද්ද 14%		***(723,967.02)***	***(90,733.00)***
ආදායම් බදුවලට පසු වර්ෂය සඳහා අතිරික්තය/ (හිඟය)		***4,447,226.00***	***(2,779,312.89)***

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය
2021 දෙසැම්බර් 31 දිනයට

	සටහන්	***2021/12/31***	***2021/12/31***
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	*12*	*432,246,149.53*	*438,432,454.78*
		432,246,149.53	***438,432,454.78***
කාරක ප්‍රාග්ධනය			
ගොඩනැගිලි ඉදිකිරීම	*13*	*46,275,072.25*	*45,357,072.25*
ජංගම වත්කම්			
තොග	*14*	*1,780,695.19*	*1,839,863.80*
ගෙවීම් සහ ලැබීම් පෙර	*15*	*3,207,170.05*	*975,474.86*
ණයකරුවෝ හා අත්තිකාරම්	*16*	*9,078,848.28*	*10,242,347.64*
කාල තැන්පතු		*22,000,000.00*	*18,000,000.00*
මුදල් හා මුදල් සමාන දේ	*17*	*30,958,378.57*	*20,125,616.45*
		67,021,092.09	***51,163,302.45***
මුළු වත්කම්		***545,542,313.87***	***534,952,829.78***
සමකොටස් හා වගකීම්			
ආණ්ඩුවේ දායකත්වය - ප්‍රාග්ධනය		*472,557,701.96*	*506,057,701.96*
සමුච්චිත අරමුදල		*27,335,268.17*	*(13,620,836.78)*
UNDP ප්‍රදාන		*208,736.38*	*714,658.79*
ව්‍යාපෘති දායකත්වය-ප්‍රාග්ධන		-	*1,595,824.75*
ආසියානු පදනමේ ප්‍රදාන		-	*291,000.00*
NELSIP ප්‍රදානය		*334,799.94*	*669,599.88*
අමාත්‍යාංශයෙන් ප්‍රදානය		*204,067.36*	*241,605.00*
ප්‍රත්‍යාගණන සංචිතය			
		24,607,273.70	*24,607,273.70*
		525,247,847.51	***520,556,827.30***
ජංගම නොවන වගකීම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	***18***	*9,559,066.50*	*9,005,625.50*
රඳවා ගැනීමේ මුදල්		*1,512,000.00*	*1,512,000.00*
		11,071,066.50	***10,517,625.50***
ජංගම වගකීම්			
ප්‍රතිපාදන - විගණන ගාස්තු		*318,000.00*	*636,000.00*
ණයකරුවෝ හා උපයාගත් ගාස්තු	***19***	*8,905,399.86*	*3,242,376.98*
		9,223,399.86	***3,878,376.98***
මුළු සමකොටස් සහ වගකීම්		***545,542,313.87***	***534,952,829.78***

01 සිට 07 පිටුවල ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වන කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශනවලින් 2021.12.31 වැනි දිනට පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා

ආයතනයේ කටයුතු සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා අතිරික්තය/ (හිඟය) පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන බවට අපි මෙයින් සහතික කරමු.

ආචා. ඩී. එම්. සූරතිස්ස
අධ්‍යක්ෂ- ප්‍ර.වි.නි.
පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

පී. ඒ. ඩී. හිරාන් රදීෂ මහතා
සහකාර අධ්‍යක්ෂ (මුදල්)
පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකියනු ලැබේ.

මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කර ඇත.

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය
මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		2021/12/31
මෙහෙයුම් කටයුතුවලින් මූල්‍ය ප්‍රවාහය		
සාමාන්‍ය කටයතුවලින් අතිරික්තය/(හිඟය)		**5,171,193.02**
2021/22 ආදායම් බදු සඳහා වෙන්කිරීම		(723,967.02)
පොලී ආදායම		(1,229,531.20)
		3,217,694.80
මූල්‍ය නොවන වලනය		
ක්ෂයවීම්		7,545,507.25
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන		910,201.00
විගණන ගාස්තු ප්‍රතිපාදන		318,000.00
දායකත්ව ආදායම		(363,585.12)
පෙර වර්ෂයේ ගැලපීම්		322,475.33
		11,950,293.26
කාරක ප්‍රාග්ධන වෙනස්කම්		
බඩුතොගවල වැඩිවීම		59,168.61
පූර්වගෙවීම් හා ලැබිය යුතු දෑවල වැඩිවීම		(2,251,695.19)
ණයකරුවෝ හා අත්තිකාරම් වැඩිවීම		1,167,499.36
ණයහිමියෝ වැඩිවීම		5,663,022.88
ගෙවූ විගණන ගාස්තු		(636,000.00)
පාරිතෝෂික ගෙවීම		(356,760.00)
මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය (1)		**15,595,528.92**
ආයෝජන කටයුතුවලින් මූල්‍ය ප්‍රවාහය		
ජංගම නොවන වත්කම් අත්කර ගැනීම සඳහා ගෙවීම්	(1,992,298.00)	
කාල තැන්පතුවල ආයෝජනය	(22,000,000.00)	
ස්ථාවර වත්කම් මුදල් ගැනීම	18,000,000.00	
ආයෝජන කටයුතුවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය (2)		**(5,992,298.00)**
මූල්‍ය කටයුතුවලින් මූල්‍ය ප්‍රවාහය		
ලැබූ පොලිය - කාල තැන්පතු	1,086,438.36	
ලැබූ පොලිය - වෙනත්	143,092.84	
මූල්‍ය කටයුතුවලින් ශුද්ධ මූල්‍ය (3)		**1,229,531.20**
වර්ෂය තුළ ශුද්ධ වලනය (1)+(2)+(3)		**10,832,762.12**
කාලපරිච්ඡේදය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ		**20,125,616.45**
කාලපරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ - සටහන ඒ		**30,958,378.57**
සටහන ඒ		
ලංකා බැංකුව - ගිණුම් අංකය 2323344		13,571,647.03
ලංකා බැංකුව - ගිණුම් අංකය 2323350		14,417,369.22
ඉතුරුම් ගිණුම - ලංකා බැංකුව - ගිණුම් අංකය 2329975		2,969,362.32
		30,958,378.57

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

ශුද්ධ වත්කම්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

විස්තරය	*ආණ්ඩුවේ දායකත්වය ප්‍රාග්ධනය*	*සමුච්චිත අරමුදල*	***UNDP*වලින් ප්‍රදානය**	*ව්‍යාපෘති දායකත්ව ප්‍රාග්ධනය*	*ආසියා පදනම ව්‍යාපෘතියෙන් ප්‍රදානය*	*ආසියා පදනම **NELSIP** ව්‍යාපෘතියෙන් ප්‍රදානය*	*අමාත්‍යාංශයෙන් ප්‍රදානය*	*ප්‍රත්‍යාගණන සංචිතය*	*එකතුව*
	රු.	*රු.*	*රු.*	*රු.*	*රු.*	*රු.*	*රු.*	*රු.*	*රු.*
2021/01/01 දිනට ශේෂය	*506,057,701.96*	*(13,620,836.78)*	*714,658.79*	*1,595,824.75*	*291,000.00*	*669,599.88*	*241,605.00*	*24,607,273.70*	*520,556,827.30*
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ හිඟය	*-*	*5,171,193.02*	*-*	*-*	*-*	*-*	*-*	*-*	*5,171,193.02*
කාලපරිච්ඡේදය සඳහා මාරු කිරීම (සටහන ඒ)	*(33,500,000.00)*	*35,513,436.00*	*(505,922.41)*	*(1,595,824.75)*	*(291,000.00)*	*(334,799.94)*	*(26,617.56)*	*-*	*(740,728.06)*
පෙර වර්ෂයේ ගැලපීම (සටහන බී)	*-*	*271,475.33*	*-*	*-*	*-*	*-*	*(10,920.08)*	*-*	*260,555.25*
2021/12/31 දිනට ශේෂය	***472,557,701.96***	***27,335,268.17***	***208,736.38***	***-***	***-***	***334,799.94***	***204,067.36***	***24,607,273.70***	***525,247,847.51***

සටහන ඒ

කාලපරිච්ඡේදය සඳහා මාරු කිරීම

	සමුච්චිත අරමුදල
	රු.
වාහන වටිනාකම ක්‍රමක්ෂය ගැලපීම	*33,500,000.00*
උසස් අධ්‍යාපන අනුග්‍රාහකත්වය සඳහා ගැලපීම	*125,000.00*
UNDPවලින් ප්‍රදාන ක්‍රමක්ෂය ගැලපීම	*714,658.79*
ආසියා පදනමෙන් ප්‍රදාන ක්‍රමක්ෂය ගැලපීම	*291,000.00*
ව්‍යාපෘති දායකත්ව ප්‍රාග්ධනය ක්‍රමක්ෂය ගැලපීම	*1,595,824.75*
අමාත්‍යාංශයේ වටිනාකම ක්‍රමක්ෂය ගැලපීම	*10,920.08*
2022/23 ආයතනික ආදායම් බදු වගකීම ගැලපීම	*(723,967.02)*
	35,513,436.60

සටහන බී

පෙර වර්ෂයේ ගැලපීම

2020 ගොඩනැගිලි පිරිවැය එකතු කිරීම ගැලපීම	*74,000.00*
2020/21 සඳහා ආදායම් බදු ගෙවීම ගැලපීම	*(90,733.00)*
හිටපු අධ්‍යක්ෂ වැටුප ගැලපීම	*268,208.33*
ගෙවිය යුතු නැන්පතු කපාහැරීම ගැලපීම	*20,000.00*
	271,475.33

කාලපරිච්ඡේදය සඳහා මාරු කිරීම

	***UNDP**වලින් ප්‍රදානය*
	රු.
UNDP සම්මන්ත්‍රණ කැමරා ප්‍රදානය	*210,904.00*
UNDP වලින් ප්‍රදානය ක්‍රමක්ෂය ගැලපීම	*(714,658.79)*
කැමරා ප්‍රදානය ක්‍රමක්ෂය ගැලපීම	*(2,167.62)*
	(505,922.41)

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

ගිණුම් සඳහා සටහන්
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		2021/12/31	2020/12/31
සටහන 01 - ආණ්ඩුවේ දායකත්වය			
2100-02	මහා භාණ්ඩාගාරය - පුනරාවර්තන	36,680,000.00	32,870,000.00
2101-03	මහා භාණ්ඩාගාරය - ප්‍රාග්ධන	3,100,000.00	7,750,000.00
	එකතුව	**39,780,000.00**	**40,620,000.00**
සටහන 02 - ඩිප්ලෝමා පාඨමාලා ආදායම			
2101-01-07-01	පළාත් පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව 2016/17	10,000.00	-
2101-01-07-02	පළාත් පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව 2017/18	605,000.00	-
2101-01-07-03	ප්‍රජා සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාව 2017/18	109,975.00	-
2101-01-07-04	පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමාව 2019/20 (පත් කළ සාමාජිකයින්)	810,000.00	30,000.00
2101-01-07-05	පළාත් පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව 2019/20 (නිලධාරීන්)	409,950.00	497,575.00
2101-01-07-06	පළාත් පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව 2021/22 (ඌව)	3,499,975.00	-
	එකතුව	**5,444,900.00**	**527,575.00**
සටහන 03 - සහතිකපත්‍ර පාඨමාලා ආදායම			
2101-02-09-06	මානව සම්පත් සහතිකපත්‍ර පාඨමාලාව 2020	125,000.00	274,925.00
2101-02-09-07	පරිගණක යෙදවුම් සහතිකපත්‍ර පාඨමාලාව 2020	-	659,850.00
2101-02-09-08	දේශපාලන විද්‍යාව සහතිකපත්‍ර පාඨමාලාව 2020	1,249,950.00	1,106,025.00
2101-02-09-09	CCLG – 2021 (නැඟෙනහිර) - පත් කළ සාමාජිකයින්	2,000,000.00	-
2101-02-09-10	CCLG – 2021 (නැඟෙනහිර) - නිලධාරීන්	1,999,975.00	-
	එකතුව	**5,374,925.00**	**2,040,800.00**
සටහන 04 - විශේෂ ව්‍යාපෘති ආදායම			
2101-10	UNDP CDLG ව්‍යාපෘතිය	21,518,014.12	2,322,478.94
2101-11	කාන්තා කවුන්සිල් සාමාජිකයින්ගේ සම්බන්ධීකරණ ආදායම	120,000.00	-
2101-12	2021 ජී සූට් වැඩමුළුව	71,975.00	-
	එකතුව	**21,709,989.12**	**2,322,478.94**
සටහන 05 - වෙනත් ආදායම			
1505-01	කාර්ය මණ්ඩල ණය පොලිය	294,337.59	268,259.76
1505-02	ප්‍රකාශන අලෙවිය	810.00	8,300.00
1505-03	ඉතුරුම් ගිණුම් පොලිය	143,092.84	157,921.62

1505-04	සේවකයින් සඳහා අත්තිකාරම් පොලිය	880.80	205.52
1505-05	ස්ථිර තැන්පතු මත පොලිය	1,086,438.36	1,535,013.70
1505-06	ආදයකත්ව ආදායම	363,585.12	380,932.50
1505-07	සැපයුම්කරුවන්ගේ ලියාපදිංචි ආදායම	109,000.00	87,000.00
	එකතුව	***1,998,144.71***	***2,437,633.10***

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

ගිණුම් සඳහා සටහන්
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		2021/12/31	***2020/12/31***
සටහන 06 - පරිපාලන සහ ආයතන වියදම්			
	පෞද්ගලික පාරිශ්‍රමික		
1503-01-01	*වැටුප් හා වේතන*	15,733,412.76	15,847,392.32
1503-01-02	*සේ.අ.අ.*	2,681,650.99	2,714,771.20
1503-01-03	*සේ.හා.අ.*	536,330.22	542,954.26
1503-01-04	*නිවාඩු ගෙවීම් සහ අතිකාල*	437,360.62	428,009.71
1503-01-05	*වෙනත් දීමනා*	5,242,012.55	4,656,357.46
	ගමන්		
1503-02-01	*ගමන් වියදම් - දේශීය*	116,021.87	77,720.21
1503-02-02	*ගමන් වියදම් - විදේශීය*	-	-
	සැපයුම්		
1503-03-01	*ලිපිලේඛන*	856,866.13	652,991.37
1503-03-02	*ඉන්ධන ලිහිසි ද්‍රව්‍ය*	973,774.06	702,100.44
1503-03-03	*නිල ඇඳුම්*	32,000.00	32,000.00
	නඩත්තු වියදම්		
1503-04-01	*වාහන*	1,764,615.01	1,912,285.47
1503-04-02	*පිරිවිතර, යන්ත්‍රසූත්‍ර හා උපකරණ*	680,716.09	487,479.12
1503-04-03	*ගොඩනැගිලි*	1,376,625.88	1,359,722.33
	කොන්ත්‍රාත් සේවා		
1503-05-01	*ගොඩනැගිලි ගාස්තු*	243,936.00	243,936.00
1503-05-02	*දුරකථන*	440,535.40	446,365.66
1503-05-03	*තැපැල් ගාස්තු*	39,730.00	131,102.40
1503-05-04	*ජලය හා විදුලිය*	896,556.48	1,072,739.10
1503-05-05	*පුවත්පත් හා වාරසඟරා*	39,870.00	37,155.00
1503-05-06	*ආරක්ෂක සේවා*	1,616,706.00	1,495,142.00
1503-05-08	*දැන්වීම් වියදම්*	69,768.00	257,428.80
1503-05-09	*ආහාරපාන*	258,663.61	138,198.69
1503-05-10	*කාර්යාල වියදම්*	556,933.53	688,425.12
1503-05-11	*බැංකු ගාස්තු*	-	7,600.00
1503-05-13	*බොල් ණය*	492,000.00	-
	එකතුව	**35,086,085.20**	**33,931,876.66**

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

ගිණුම් සඳහා සටහන්
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		2021/12/31	2020/12/31
සටහන 07 - මානව සම්පත් සංවර්ධන වියදම්			
2201-05-01	**මානව සම්පත් සංවර්ධන වියදම්-පුහුණු වැඩසටහන්**		
2201-05-01-02	මානව සම්පත් සංවර්ධන වියදම්-ඉංජිනේරු අංශය	297,165.60	570,697.00
2201-05-01-03	මානව සම්පත් සංවර්ධන වියදම්-සාමාන්‍ය කළමනාකරණ අංශය	376,569.03	139,645.95
2201-05-01-04	මානව සම්පත් සංවර්ධන වියදම්-භෞතික සැලසුම් අංශය	708,343.50	279,871.50
2201-05-01-05	මානව සම්පත් සංවර්ධන වියදම්-මූල්‍ය කළමනාකරණ අංශය	188,700.00	692,247.35
2201-05-01-06	මානව සම්පත් සංවර්ධන වියදම්-නීති අංශය	150,175.00	447,865.00
2201-05-01-07	මානව සම්පත් සංවර්ධන වියදම්-අධ්‍යයන අංශය	702,057.50	520,262.50
2202-05-01-08	මානව සම්පත් සංවර්ධන වියදම්-ICT අංශය	338,235.00	430,945.00
2202-05-01-09	මානව සම්පත් සංවර්ධන වියදම්-පරිසර අංශය	-	324,471.00
2203-05-01-10	මානව සම්පත් සංවර්ධන වියදම්-මාධ්‍ය අංශය	335,398.76	277,562.25
2201-05-03	මානව සම්පත් සංවර්ධන වියදම්- SLILG සහ අධ්‍යක්ෂ අංශයේ ධාරිතා සංවර්ධනය	515,299.00	585,939.50
2201-05-04	මානව සම්පත් සංවර්ධන වියදම්-පර්යේෂණ අංශය	1,739,822.49	480,527.32
2203-05-01-11	මානව සම්පත් සංවර්ධන වියදම්-පරිපාලන අංශය	125,000.00	-
	එකතුව	**5,476,765.88**	**4,750,034.37**
සටහන 08 - ඩිප්ලෝමා පාඨමාලා වියදම්			
2201-06-01-07-03	පළාත් පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව 2016/17 වියදම් - සම්මාන උළෙල	364,112.98	-
2201-06-01-07-04	පළාත් පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව 2017/18 වියදම්	264,000.00	11,600.00
2201-06-01-07-04	පළාත් පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව 2019/20 වියදම්	-	-
2201-06-01-07-05	ප්‍රජා සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාව 2017/18 - සම්මාන උළෙල	235,749.02	-
2201-06-01-07-10	පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමාව 2019/20 (පත් කළ සාමාජිකයින්)	611,815.18	452,202.14
2201-06-01-07-11	පළාත් පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව 2019/20 (නිලධාරීන්)	318,170.14	372,139.85
2201-06-01-07-12	පළාත් පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව 2021/22 (උෆව)	2,027,719.81	
		3,821,567.13	**835,941.99**

		2021/12/31	2020/12/31
සටහන 09 - සහතිකපත්‍ර පාඨමාලා වියදම්			
2201-06-02-09-09	මානව සම්පත් සහතිකපත්‍ර පාඨමාලාව 2020	81,000.00	59,766.20
2201-06-02-09-14	පරිගණක යෙදවුම් සහතිකපත්‍ර පාඨමාලාව 2020	-	299,081.00
2201-06-02-09-11	දේශපාලන විද්‍යාව සහතිකපත්‍ර පාඨමාලාව 2020	107,917.38	162,364.00
2201-06-02-09-12	CCLG – 2021 (නැඟෙනහිර) - පත් කළ සාමාජිකයින්	421,119.38	-
2201-06-02-09-13	CCLG – 2021 (නැඟෙනහිර) - නිලධාරීන්	428,260.58	-
	එකතුව	**1,038,297.34**	**521,211.20**
සටහන 10 - විශේෂ ව්‍යාපෘති වියදම්			
1504-08	UNDP CDLG ව්‍යාපෘතිය	14,928,882.01	1,605,559.67
1504-09	G suit 2021 පිළිබඳ වැඩමුළුව	11,460.00	-
		14,940,342.01	**1,605,559.67**
සටහන 11 – විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සහ ක්ෂයවීම්			
2102-03	පාරිතෝෂිකය	910,201.00	1,572,577.00
2102-04	විගණන ගාස්තු	318,000.00	254,000.00
2105-02	ක්ෂයවීම්	7,545,507.25	7,165,866.04
	එකතුව	**8,773,708.25**	**8,992,443.04**

සටහන 12 – දේපළ, පිරියත සහ උපකරණ

		2021/01/01 දිනට පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකම	එකතු කිරීම් 2021	ඉවත් කිරීම් 2021	2021/12/31 දිනට එකතුව	2021/01/01 දිනට ක්ෂයවීම්	ක්ෂයවීම් 2021	2021/12/31 දිනට W.D.V.
2201-01	ඉඩම්	406,890,000.00	-	-	406,890,000.00	-	-	406,890,000.00
2201-02	ගොඩනැගිලි	17,130,872.13	74,000.00	-	17,204,872.13	13,434,084.52	860,243.64	2,910,543.97
